# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2014 - 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා - 2017.04.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි
අධිකරණ අමාත්‍යාංශය

නීතිපති දෙපාර්තමේන්තුවේ සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) තනතුර සඳහා බඳවා ගැනීම

නීතිපති දෙපාර්තමේන්තුවේ සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) තනතුරු පුරප්පාඩු තිහක් (30) පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 50ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 05 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*
(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.
(ii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින්ද යුක්ත විය යුතුය.
(iii) *වෙනත් :*
* ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
* විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
* ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවෙකු වී නොතිබිය යුතුය.
* අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) වයස් සීමාව :
ඉල්ලුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩුවිය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-*
මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැත.

04. සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) තනතුර සඳහා රු. 26,000 ක මාසික දීමනාවක් හා රජයේ අනුමත අනෙකුත් දීමනා හිමිය

05. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.*

| *කරුණ* | *උපරිම ලකුණු* | *විස්තරය* | *ලකුණු* |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 20 | i. රජයේ පිළිගත් ආයතනයකින්/විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන පශ්චාත් නීතිවේදී උපාධිය (LLM) | ලකුණු 10 |
| | | ii. රජයේ පිළිගත් ආයතනයකින්/විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන අදාළ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | ලකුණු 08 |
| | | iii. රජයේ පිළිගත් ආයතනයකින්/විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) පළමු පෙළ සාමාර්ථය | ලකුණු 07 |
| | | iv. රජයේ පිළිගත් ආයතනයකින්/විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ ඉහළ සාමාර්ථය | ලකුණු 06 |
| | | v. රජයේ පිළිගත් ආයතනයකින්/විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන නීතිවේදී උපාධිය (LLB) දෙවන පෙළ පහළ සාමාර්ථය | ලකුණු 05 |
| | | vi. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පළමු පෙළ ගෞරව සාමාර්ථය | ලකුණු 07 |
| | | vii. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය දෙවන පෙළ ගෞරව සාමාර්ථය<br>රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයක් යනු, සංස්ථාපිත නීති අධ්‍යාපන සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ ආයතනයක් වේ.<br>(ඉහත සඳහන් සියළුම කුසලතාවන් උපරිම ලකුණු 20කට සීමාවේ.)<br>* ඉහත අධ්‍යාපන සුදුසුකම් සහතික මගින් සනාථ කළ යුතුය. | ලකුණු 06 |
| 02. නීතිඥවරයෙකු ලෙස ලබා ඇති වෘත්තිය පළපුරුද්ද | ලකුණු 20 | i. අධිකරණයේ නඩු මෙහෙයවීම (එක් අවුරුද්දක් සඳහා ලකුණු 02 බැගින්) | ලකුණු 10 |
| | | ii. රජයේ හෝ පිළිගත් නීති ආයතනයක නීතිඥවරයෙකු ලෙස අධිකරණයේ නඩු මෙහෙයවීමෙන් දක්වන ලද කුසලතා (ඉහත සඳහන් කුසලතා සඳහා සහතික ඉදිරිපත් කළ යුතුය)<br>*සටහන.*-විනිශ්චයකාරවරයෙකුගෙන් වෘත්තිය හැකියාව පිළිබඳ සහතිකයක් සහ අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරුන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික ඉදිරිපත් කළ යුතුය. නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් නිකුත් කරන ලද චරිත සහතික අදාළ නොවේ. | ලකුණු 10 |
| 03. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | ලකුණු 50 | i. සන්නිවේදන කුසලතාවය | ලකුණු 12.5 |
| | | ii. හිටිවන කථිකත්වයේ කුසලතාවය | ලකුණු 12.5 |
| | | iii. සභාව ඉදිරියේ සාර්ථකව පෙනී සිටීමේ කුසලතාවය | ලකුණු 12.5 |
| | | iv. භාෂාව හැසිරවීමේ හැකියාව | ලකුණු 12.5 |
| 04. විශේෂ දක්ෂතා | ලකුණු 10 | (i) පෞරුෂත්වය | ලකුණු 05 |
| | | (ii) නායකත්ව ගුණාංග | ලකුණු 05 |

06. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*-ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය

07. අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

(i) කොළඹ 12, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන අංශයෙන් අයදුම්පත් ලබාගත හැකි අතර, 2017.05.09 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ''නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, තැ. පෙ. 502, කොළඹ 12.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. 2017.05.09 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

08. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

09. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජයන්ත ජයසූරිය,
ජනාධිපති නීතිඥ,
නීතිපති.

2017 මාර්තු මස 22 වැනි දින.
උපරිමාධිකරණ සංකීර්ණය.
නීතිපති දෙපාර්තමේන්තුව.
කොළඹ 12.

04-149

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අප්‍රේල් මස 28 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.”

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත)

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරෙහි පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතුරින් කුසලතාව මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරු බඳවා ගනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

2.1 වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද
(i) නීතිඥයෙකු වීම හෝ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් පරීක්ෂකයෙකු වීම.

*හා*

(ii) නීතිඥයෙකු නම් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අවුරුදු 05ක සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියෙක් වීම හෝ උපාධිධාරී සමාගම් පරීක්ෂකයෙකු නම් අවුරුදු 10කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියකු වශයෙන් පළපුරුද්දක් තිබීම.

2.2 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සහ විදේශීය ඕනෑම රටක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 වෙනත් :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි
(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම අවුරුදු 01ක වැඩබැලීමේ කාලයකට යටත් ය. විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

4. වැටුප් පරිමාණය :
මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 එස්. එල්. - 1-2016 අනුව රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 -110,895 වේ. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව ගෙවීම් සිදුකරනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.
(ii) සම්මුඛ පරීක්ෂණය සඳහා වන සවිස්තරාත්මක ලකුණු ලබාදීමේ ක්‍රමය පහත දක්වා ඇත.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 |
| 3. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 25 |
| 4. අතිරේක පළපුරුද්ද | 30 |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 05 |
| | 100 |

6. අයදුම් කරන ආකාරය :
(i) අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 6 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය දෙවන හා තෙවන පිටුවට ද ඇතුලත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.
(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ගාලු පාර, කොළඹ 03 වෙත 2017.04.21 වන ද හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස කෙලවරේ 'සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත)' යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුය.
(iii) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේදී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.
(iv) මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

7. අයදුම්කරුගේ අනන්‍යතාවය :
අයදුම්කරු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුවේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ. :

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. සාවද්‍ය තොරතුරු සැපයීම
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
චින්තක එස්. ලොකුහෙට්ටි,
ලේකම්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.

2017 අප්‍රේල් මස 07 වැනි දින.
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
ගාලු පාර,
කොළඹ 03.

## ආදර්ශ අයදුම්පත්‍රය

### කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම (සීමිත) (2017)

01. 1.1 මුලකුරු අගට යොදු මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 දුරකථන අංකය :————.

03. 3.1 උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.2 2017.04.21 දිනට වයස :
අවු. :————. මාස :————. දින :————.

04. 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදළ කොටුව තුළ ලියන්න.) ☐
පුරුෂ - 0
ස්ත්‍රී - 1

4.2 විවාහක/අවිවාහක බව :————.

05. 5.1 ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග :————.
(පරම්පරාවෙන්ද ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න.)
5.2 ජාතිය :————.
5.3 ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. ඔබ 2017.04.21 දිනට වූ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත්වූ භාෂාව සඳහන් කරන්න. :————.

07. 7.1 නිවේදනයේ 02 වන ඡේදයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබේද? :————.
7.2 වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද :
නිවේදනයේ 2.1 (i) ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ නීතිඥයකු වීම/සමාගම් පරීක්ෂකයකු වීම යන ඒවායින් කුමකින් ද? :————.
7.3 වෘත්තිය සුදුසුකම් :
නීතිඥයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :————.
ලියාපදිංචි අංකය :————.
7.4 2017.04.21 දිනට වෘත්තිය පළපුරුද්ද :
අවු :————. මාස :————. දින :————.

7.5 අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබා දෙන සේවා/ශ්‍රේණිය සඳහන් කරන්න.
දැනට දරන තනතුර :————.
ශ්‍රේණිය :————.
පන්තිය/ඛණ්ඩය :————.
තනතුරට පත්වූ දිනය :————.
එම තනතුරේ ස්ථිර කළ දිනය :————.

අයදුම්කිරීම සඳහා සේවා කාලයන් කිහිපයක් අදළ නම් එම සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කරන්න. :

| *සේවය/ශ්‍රේණිය නම* | *පත් වූ දිනය* |
|---|---|
| | |

7.6 නිවේදනයේ 02 වන ඡෙදයේ සඳහන් පරිදි අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2017.04.21 දිනට සතුටුදායක සේවා කාලය :————.
7.7 අධ්‍යාපන සුදුසුකම් (අදළ වේ නම් පමණක්)

| *උපාධියේ නම හා වර්ෂය* | *විශ්වවිද්‍යාලය/ ආයතනය දිනය* | *ලියාපදිංචි අංකය* | *බාහිර/ අභ්‍යන්තර* | *විෂයයන්* | *සමත්වූ පන්තිය* | *උපාධිය වලංගුවන දිනය* |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

08. 8.1 කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද ? :————.
8.2 පිළිතුර ''ඔව්'' නම් ඒ පිළිබඳ විස්තර :————.

09. *අයදුම්කරුගේ සහතිකය* :
2017.04.21 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද/දස අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත් වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ලම මා විසින් උපයා ගෙන ඇති බවත්, නිවේදනයේ 2.1 (ii) ඡේදයට අනුව 2017.04.21 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අවුරුදු (පහක/දහයක) සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට මා සුදුස්සකු වන බවත්, මෙහි සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. මෙම සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පටිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, සම්මුඛ පරීක්ෂණයට පෙර එය පවත්වත්දී හෝ ඉන්පසුව හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව) :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................මයා/මිය/මෙය සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ .............. තනතුරක සේවය කරන බව ද, 2017.04.21 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු/දස අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයා ගෙන ඇති බවත්, එම කාල සීමාව තුළ වරදකට/(අවවාද කිරීමකට හැර) කිසිම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, නිවේදනයේ 2.1 (ii) ඡේදයට අනුව 2017.04.21 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ අවුරුදු (පහක/දහයක) සතුටුදායක සේවා කාලයක් සහිත බවද අදළ නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, ඔහු/ඇය .............. දින මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බව ද මෙයින් සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.

04-207

### අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීමයි

### ශ්‍රී ලංකා පොලීසිය

උප පොලිස් පරීක්‍ෂක, පොලිස් කොස්තාපල්, කාන්තා පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුර - විශේෂ කාර්ය බලකාය

2017.02.09 දින පළ කරන ලද අංක 2006 දරන *ගැසට් පත්‍රයේ* I:කොටස II (අ) ඡෙදය - තනතුරු ඇබෑර්තු හි නිවේදන අංක 460/1, 460/2, 460/3 හා 460/4 හි අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2017.04.15 දක්වා දීර්ඝ කරනු ලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති.
පරිපාලන.

2017 මාර්තු මස 24 වැනි දින,
කොළඹ 01,
පොලිස් මූලස්ථානයේ දී.

04-218

---

### කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම

කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුවේ පුරප්පාඩුව පවතින කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියේ තනතුරු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරේ ස්වභාවය :

I. ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. බඳවා ගනු ලබන්නේ කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියටය.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි මෙම තනතුරට හිමි මාසික වැටුප් ප්‍රමාණය රු. 24,250 - 10X250 - 10X270 - 10X300 - 12X330 - රු. 36,410 (PL -1 - 2016) වේ. (රා.ප.ච 03/2016 හි උපලේඛන II හි විධිවිධාන අනුව) රු. 14,526 ට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් සමත් විය යුතුය.

III. පැවරෙන රාජකාරි :
- (*අ*) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු මුලස්ථානයේ හා බාහිර කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම, කාර්යාල භූමිය පිරිසිදු කිරීම හා නඩත්තු කටයුතුවලට සහය වීම, කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කරන උපකරණ කොටුව පිරිසිදු කිරීම හා නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාම.
- (*ආ*) කාලගුණ විද්‍යා උපකරණ පිරිසිදු කිරීම් සිදු කිරීම/ නඩත්තු කිරීම්වලට සහාය වීම. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු මූලස්ථානයේ හා බාහිර කාර්යාලයන්හි කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු-වලට සහය වීම.
- (*ඇ*) රාත්‍රී කාලයේ ප්‍රාදේශීය කාර්යාලවල උපකරණ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම.

IV. සේවා මුර ක්‍රමයට රාජකාරියේ යොදවනු ලබන අතර රාත්‍රී සේවා මුරයන්වලද රාජකාරි ඉටු කළ යුතු වේ.

03. සුදුසුකම් :

මූලික සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. 2017.05.08 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුතු මේ වන විට සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
IV. අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් විය යුතුය.

කායික සුදුසුකම් :

V. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. බඳවා ගැනීමෙන් පසු පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයේ දී සේවය සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවය නොමැති බව තහවුරු වුවහොත් තනතුරට නුසුදුසු සේ සළකා සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
VI. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2017.05.08 වැනි දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

04. මෙයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2017.05.08 දින ප.ව. 4.15 ට පෙර ලැබෙන සේ ''කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව, අංක 383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " කාලගුණ විද්‍යා සහායකයින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් " යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කවර හේතුවක් නිසා හෝ ක්‍රියා නොකරනු ලබන අතර, දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සිය අයදුම්පත තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

05. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පතේ ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙනු ලබන්නේ ලකුණු පටිපාටිය පදනම් කර ගනිමිනි.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර* | *ලකුණු ප්‍රමාණය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** (මූලික සුදුසුකම්වලට අමතරව අධ්‍යාපන සුදුසුකම්) උපරිම ලකුණු 40 කි.<br>I. *අ.පො.ස. සාමාන්‍ය පෙළ*<br>● ගණිතය, භාෂාව, විද්‍යාව, ඉංග්‍රීසි, සෞන්දර්ය, තාක්ෂණය ඇතුලුව විෂයන් 06ක් සඳහා එක් සාමාර්ථයක් වෙනුවෙන් පහත පරිදි වේ.<br>විෂයන් 10: A - 4, B - 3, C - 2, S - 1<br>විෂයන් 09: A - 4, B - 3, C - 2, S - 1<br>විෂයන් 08: D - 4, C - 3, S - 1 | 24 | 40 |
| II. *අ.පො.ස. උසස් පෙළ*<br>● විභාගයේ එක් සාමාර්ථයක් වෙනුවෙන් ලබන ලකුණු පහත වේ.<br>විෂයන් 04: A - 3, B - 2, C - 2, S - 1<br>විෂයන් 03: A - 4, B - 3, C - 2, S - 1 | 12 | |
| III. මව්බසට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව හැසිරවීමේ හැකියාව | 02 | |
| IV. ඉංග්‍රීසි (ජාත්‍යන්තර භාෂාව) හැසිරවීමේ හැකියාව | 02 | |
| 02. **තනතුරට අදාල ක්ෂේත්‍ර පළපුරුද්ද**<br>● 1 වසරකට ලකුණු 04 බැගින් උපරිම වසර 5 කි. | | 20 |
| 03. **තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා සහ ලබා ඇති පුහුණුව** (එක් පාඨමාලාවකට ලකුණු 5 බැගින්)<br>● සිවිල් නඩත්තු, ජල නල කාර්මික, විදුලි කාර්මික ආදී කාර්මික සහතික පත්‍ර පාඨමාලා<br>● පරිගණක සහතික පත්‍ර පාඨමාලා | | 25 |
| 04. **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව**<br>● සන්නිවේදන හැකියාව, පෞරුෂය, නායකත්වය, ආචාරශීලි බව, අවබෝධය | | 15 |

ඉහත පරිදි ව්‍යුහගත පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල මුලු එකතුව අනුව දක්වන කුසලතා අනුපිළිවෙලින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

06. *භාෂා ප්‍රවීණතාව.*—රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදල මට්ටමේ භාෂා ප්‍රවීණතාවය සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතු ය. පත්වීමේ දින සිට වසර 05 ක් තුල නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් නතර කරනු ඇත.

07. අයදුම්කරුවන් පහත දක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය) :-

I. උප්පැන්න සහතිකයේ පැහැදිලි ඡායා පිටපතක්
II. ජාතික හැඳුනුම්පතෙහි පැහැදිලි ඡායා පිටපතක්
III. අධ්‍යාපන සුදුසුකම් සහ පුහුණුව (ලබා තිබේ නම්) සනාථ කිරීම සඳහා වූ සහතිකවල ඡායා පිටපත්,
IV. සේවා පළපුරුද්ද සම්බන්ධව සහතික (තිබේ නම් පමණක්) වල ඡායා පිටපත්
V. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකය
VI. 2016.11.08 දිනට පසු දිනකදී ලබා ගත් චරිත සහතික දෙකක්.

08. සම්මුඛ පරීක්ෂණයකට කැඳවූ අවස්ථාවේ හා පත් වීම් බලධාරියා ඉල්ලුම් කරන ඕනෑම අවස්ථාවක සහතිකපත්වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

09. මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

*සටහන :*
සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ලලිත් චන්ද්‍රපාල,
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2017 මාර්තු මස 24 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

### ආදර්ශ අයදුම්පත්‍රය

### කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යා සහායක III ශ්‍රේණියට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම : (සිංහල/දෙමළ) :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (සිංහල/දෙමළ) :————.
03. මුලකුරු අගට යොදු මුලකුරු සමග නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (*උදා:* SILVA A.B.C.) :————.
04. ස්ථිර පදිංචි ලිපිනය :————.
05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.
06. සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්) :————.
07. උපන් දිනය :————.
08. 2017.05.08 දිනට වයස :————.
09. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.
10. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |
11. විවාහක/ අවිවාහක බව :————.
12. දුරකථන අංකය :————.
13. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ)

i. පළමුවර පෙනී සිටීම
වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සමාර්ථය* | *විෂයය* | *සමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ii. දෙවනවර පෙනී සිටීම
වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සමාර්ථය* | *විෂයය* | *සමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර :

| අනු. අංකය | ආයතනය | පළපුරුද්ද සහතික කරන ලේඛනවල ඡායා පිටපත් |
|---|---|---|
| 1 | | අමුණා ඇත / අමුණා නැත |
| 2 | | අමුණා ඇත / අමුණා නැත |
| 3 | | අමුණා ඇත / අමුණා නැත |
| 4 | | අමුණා ඇත / අමුණා නැත |
| 5 | | අමුණා ඇත / අමුණා නැත |

අමුණා ඇති ලේඛන ඡායා පිටපත් සංඛ්‍යාව :————.

15. ලබා ඇති පුහුණුව පිළිබඳ විස්තර :

| අනු අංකය | ලබා ඇති පුහුණුව | ආයතනය | කාල සීමාව | සනාථ කෙරෙන සහතික වල ඡායා පිටපත් |
|---|---|---|---|---|
| 1 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 2 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 3 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 4 | | | | අමුණා ඇත / අමුණා නැත |
| 5 | | | | අමුණා ඇත / අමුණා නැත |

අමුණා ඇති ලේඛන ඡායා පිටපත් සංඛ්‍යාව :————.

16. අතිරේක අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :

| අනු අංකය | සුදුසුකම | සුදුසුකම් සනාථ කරන ලේඛන වල ඡායා පිටපත් |
|---|---|---|
| 1 | | අමුණා ඇත / අමුණා නැත |
| 2 | | අමුණා ඇත / අමුණා නැත |
| 3 | | අමුණා ඇත / අමුණා නැත |
| 4 | | අමුණා ඇත / අමුණා නැත |
| 5 | | අමුණා ඇත / අමුණා නැත |

අමුණා ඇති ලේඛන ඡායා පිටපත් සංඛ්‍යාව :————.

17. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම සඳහන් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය හා වැරදි බව මා තෝරා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් කිසිදු කොන්දේසියකින් තොරව සේවය අවසන් කිරීමට යටත් වන බවත් මම දනිමි.

මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, පුරප්පාඩු පවතින ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට ද කැමැත්ත ප්‍රකාශ කරමි.

————,
අත්සන.

දිනය :————.

18. දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවත් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුය.

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් සේවා ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………… මයා/මිය/මෙනවිය…………… අමාත්‍යංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/කාර්යාලයේ ……… දින සිට ……… තනතුරේ සේවය කරන බවත්, ඔහු/ඇය සේවයේ ස්ථිර කර ඇති/නැති බවත්, සේවා කාලය තුල විනය කරුණක් සඳහා වරදකරු වී ඇති/නැති බවත්, මෙහි සඳහන් තොරතුරු ඔහුගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව නිවැරදි බවත්, මොහු මෙම තනතුරට තෝරා ගනු ලැබ-වුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් කාරුණිකව දන්වමි.

සහතික කරන අයගේ නම/තනතුර/ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න.)
අත්සන හා දිනය :————.

04-155

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL02-2016) තනතුරු වලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 02-2016) මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගන්නා තනතුර : ශ්‍රේණිය

1. මැනුම් ක්ෂේත්‍ර සහායක — III ශ්‍රේණිය

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය :

| *තනතුර* | *ප්‍රධාන කාර්යයන්* |
|---|---|
| මැනුම් ක්ෂේත්‍ර සහායක | ● මැනුමට අදාළ දළ සැලැස්ම ඇඳීමට සහාය වීම<br>● මැනුම් ක්ෂේත්‍ර පොත් සහ පිඹුරු උපයෝගි කරගෙන පැරණි මායිම් නිරික්ෂණය කිරීමට හැකි වන සේ මැනුම් රේඛා සකස් කිරීම<br>● මැනුමට අදාළ වන ක්ෂේත්‍රයේ පැරණි මායිම්වල අදාළ කුඤ්ඤ මායිම් ගල් පිහිටුවීම සහ විවෘත කිරීම<br>● මැනුමට අදාළ පිල් ලකුණු සොයා ගැනීම හා පිහිටුවීමට අදාළ මැනුම් රාජකාරි වලට සහාය වීම<br>● ක්ෂේත්‍රයේදී භාවිතා කරන උපකරණ ආරක්ෂා කිරීම සහ ගබඩා කර ගැනීමට අදාළ නඩත්තු කටයුතු වලට සහාය වීම<br>● විකෝණමාන ලෙවල් උපකරණ සහ නව ඉලෙක්ට්‍රොනික් පූර්ණමාන ඇතුළු චන්ද්‍රිකා තාක්ෂණය ඇසුරෙන් කරනු ලබන මැනුම් සඳහා වූ G. P. S. උපකරණ ක්ෂේත්‍රයේ මැනුම් ලක්ෂවල ස්ථාන ගත කිරීම.<br>● ගුවන් ඡායාරූපකරණයට අවශ්‍ය භූමි පාලන ලක්ෂයන් ස්ථානගත කිරීමේ සියළුම කටයුතු සඳහා සහාය වීම<br>● මැනුම් කටයුතු වලදී ගනු ලබන සියළුම ස්ථානවල පිහිටීම හා මට්ටම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය ඉලක්කයන් දර්ශක විධිමත් අයුරින් තබා ගැනීම, මැනුම් දත්ත එක් රැස් කිරීමට සහාය දැක්වීම<br>● මැනුම් කටයුතු වලදී නිවැරදි දත්ත භාවිතා කර මායිම්, ගල්, පිල් ලකුණු භූමියේ පිහිටුවීම.<br>● මැනුම් ක්ෂේත්‍ර පොත් හා අනු රේඛන සටහන්වල දත්ත උපයෝගී කරගෙන මූලිකවම කරනු ලබන ඉඩම් කට්ටි කිරීමට අදාළ මායිම් ගල් පිහිටුවීම<br>● සර්වේයර් ජනරාල් විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පවරනු ලබන ඉඩම් මැනුම් සම්බන්ධ ඕනෑම රාජකාරියක නිරත වීම<br>● මැනුම් ක්ෂේත්‍ර සහායක ශ්‍රේණියේ ඕවර්සියර් තනතුර දරන තැනැත්තන් හට ඉහත රාජකාරි වලට අමතරව, අනෙකුත් මැනුම් ක්ෂේත්‍ර සහායකයන්ගේ කාර්යයන් අධීක්ෂණය ද පැවරේ. |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප :-
අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III, II, I හා විශේෂ ශ්‍රේණිය සඳහා අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - 38,450 ක් වන අතර එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

4.0 මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව නිර්ණය කරනු ලැබේ. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. මෙම ගැසට් නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාල වන පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

5.0 සුදුසුකම් :-

5.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත්වී තිබිය යුතුය.

5.2 වෘත්තීය සුදුසුකම් :

මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

5.3 අවම නිපුණතා :
(අ) මැනුම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහාය වීම.
(ආ) මැනුම් උපකරණ හා ආම්පන්න ආරක්ෂා කිරීම හා නඩත්තුව.

5.4 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.5 වෙනත් :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5.6 වයස :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 45 වේ.
(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

6.0 සාවද්‍ය තොරතුරු සැපයීම :-
මෙම පුරප්පාඩු පිරවීමේ දී කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයක් මගිනි.

විභාග පරිපාටිය :

විභාගය විෂයයන් දෙකකින් යුක්ත ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය | කාලය |
|---|---|---|---|---|
| I | සාමාන්‍ය දැනීම | 100 | 40% | පැය 02 |
| II | බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 විනාඩි 15 |

7.1 විෂය නිර්දේශය :

I සාමාන්‍ය දැනීම : මෙම ප්‍රශ්න පත්‍රය මගින් අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික, ආගමික හා ආර්ථික පරිසරය ද විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද අන්තර්ජාතිකව වැදගත් වන සාමාන්‍ය කරුණු පිළිබඳ දැනුම ද අපේක්ෂා කෙරේ.

II බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ සිතීමේ ශක්තිය, තර්කානුකුලභාවය, අවස්ථානෝචිත තීරණ ගැනීමේ හැකියාව ද මැනීම සඳහා වූ බහුවරණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

8.0 තේරීමේ පරිපාටිය :
8.1 මැනුම්පති විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කරන සහතික පරීක්ෂා කිරීම සඳහා ම පමණක් වන සම්මුඛ පරීක්ෂණයකින් පසු ලිඛිත විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ලකුණු කුසලතා අනුපිළිවෙල මත පමණක් III ශ්‍රේණියේ මැනුම් ක්ෂේත්‍ර සහායක වශයෙන් බඳවා ගනු ලැබේ.

බඳවා ගන්නා මැනුම් ක්ෂේත්‍ර සහායකයන්හට එක් මසක ක්ෂේත්‍ර හා න්‍යායික පුහුණුවක් මිනින්දෝරු දෙපාර්තමේන්තු පුහුණු කිරීමේ ආයතන මගින් ලබා දෙනු ඇත.

9.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතු ය. අංක 01 සිට 06 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 07- 09.2 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 10 - 14 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 15-16.2 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතු වේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූළ නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.1 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට ගැසට් නිවේදනයේ 5 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම්කළ යුතු වේ. නියමිත විභාග ගාස්තු ගෙවා 2017.05.15 දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට ස්ර්වේයර් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාග යට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ''ප්‍රාථමික අර්ධ ශීල්පීය තනතුරුවලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.0 විභාග ගාස්තු :
විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුළ පාර අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් සිතියම් ගත කිරීමේ ආයතනය - දියතලාව වෙත ගෙවා ලබා ගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 අයදුම්පත්‍ර යොමු කිරීම :
සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017.05.15 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (විභාග),
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

12.0 විභාගයට පෙනී සිටීම :
විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

13.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :
විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත
iii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී.එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2017 මාර්තු මස 21 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2-2016) තනතුරුවලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. විභාග අංකය :

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටු තුළ සංකේතය/අංකය යොදන්න.)

03. මුලකුරු සමග නම : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

3.1 මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

05. උපන් දිනය
වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

05.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස
අවු :—————. මාස :—————. දින :—————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F)

07. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :—————.
සිංහලෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.

7.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය : දිස්ත්‍රික්කයේ නම :

7.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද ? :—————.

08. දුරකථන අංකය : ස්ථාවර :—————. ජංගම :—————.

09. අධ්‍යාපන සුදුසුකම් :

9.1 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

9.2 අ. පො. ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

දෙවනවර :

(i) විභාග වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

10. වෘත්තීය සුදුසුකම් : (ලබාගෙන ඇති NVQ නිපුණතාවය පිළිබඳ විස්තර සඳහන් කරන්න.) :—————.
11. වෙනත් සුදුසුකම් :—————.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
( ✓ ) ලකුණ යොදන්න.

ඔව් නැත

12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :—————.

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
(ii) ලදුපත් අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

14. අයදුම්කරුගේ සහතිකය :
(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) රු. ............ක් ගෙවා ලබා ගත් ලදුපත අදාළ ස්ථානයේ අලවා ඇත.
(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඉහත 14 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන්නාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

16.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/ අසතුටුදායකය, සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත, කිසිදු විනය දඬුවමකට ලක්ව ඇත/නැත.

16.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරා ගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය.
අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :—————.

උපලේඛනය 1

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 07.1 හි සඳහන් ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| | නගරය/දිස්ත්‍රික්ක නාම | නගර/දිස්ත්‍රික්ක අංකය |
|---|---|---|
| 1. | කොළඹ | 01 |
| 2. | ගම්පහ | 02 |
| 3. | කළුතර | 03 |
| 4. | මහනුවර | 04 |
| 5. | මාතලේ | 05 |
| 6. | නුවරඑළිය | 06 |
| 7. | ගාල්ල | 07 |
| 8. | මාතර | 08 |
| 9. | හම්බන්තොට | 09 |
| 10. | කුරුණෑගල | 10 |
| 11. | පුත්තලම | 11 |
| 12. | අනුරාධපුර | 12 |
| 13. | පොළොන්නරුව | 13 |
| 14. | බදුල්ල | 14 |
| 15. | මොණරාගල | 15 |
| 16. | රත්නපුර | 16 |
| 17. | කෑගල්ල | 17 |
| 18. | අම්පාර | 18 |
| 19. | මඩකලපුව | 19 |
| 20. | ත්‍රිකුණාමලය | 20 |
| 21. | යාපනය | 21 |
| 22. | වවුනියාව | 22 |

04-73

---

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පුරප්පාඩු ගණන* : 07

2. *තනතුරේ ස්වභාවය* :
මැනුම් කටයුතුවලට අදළ උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම සහ සේවා කිරීම.

3. (i) *පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර* :

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100% | 40% |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100% | 40% |

(ii) මෙම ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාව මත තේරීම් කරනු ලැබේ.

4. *බඳවා ගැනීමේ ශ්‍රේණිය* :

මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර III ශ්‍රේණිය

5. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර තෝරා ගනු ලබන නිලධාරීන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සුදානම්ව සිටිය යුතු ය. මෙම *ගැසට්* නිවේදනය ආරම්භයේ ඇති රාජ්‍ය සේවයේ පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

6. *වැටුප් පරිමාණය* :
MT1-2016 - රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890

මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වන අතර, රා. ප. ච. 03/2016හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 | රු. 29,840 |
| II ශ්‍රේණිය | පියවර 12 | රු. 33,190 |
| I ශ්‍රේණිය | පියවර 23 | රු. 37,250 |

7. *වයස් සීමාව* :
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර වයස 35ට නොවැඩි විය යුතු ය.

8. *අධ්‍යාපන සුදුසුකම්* :
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී-

1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව
2. විද්‍යාව, ගණිතය

සඳහා සම්මාන සාමාර්ථයන් තුනක් (03) සමග එක්වරක දී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම;

*සහ*

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) ගණිත විෂය ධාරාව සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම්* :
රජය පිළිගත් කාර්මික විදුහලකින් ඉලෙක්ට්‍රොනික හෝ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ එක් අවුරුදු පාඨමාලාවක් හදාරා තිබීම.

9. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මත පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

10. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර* :

(*අ*) (i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම් පත්‍ර සකසා ගත යුතු අතර, ඉල්ලුම්පතේ 01 වැනි පිටුවේ අංක 01 සිට 08 දක්වාත්, 02 වන පිටුවේ අංක 09 සිට 12 දක්වාත්, 03 වන පිටුවේ අංක 13 සිට 16 දක්වාත් ඡේදයන් ඇතුළත් විය යුතු අතර විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර'' යනුවෙන් සඳහන් කර 2017 මැයි මස 07 දින හෝ ඊට පෙර ''මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය.)

(ii) අසම්පූර්ණ, නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත්‍ර ගැන වගකියනු නොලැබේ.

(iv) මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකරයි.

(v) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

(*ආ*) ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද හමුදාවේ, ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව වෘත්තීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය හැක.

12. පහත සඳහන් ලියවිලි ද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය. :
(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකයක්,
(iv) චරිත සහතික දෙකක්.
***සැලකිය යුතුයි.***-අධ්‍යාපන, වෘත්තීය හා උප්පැන්න සහතිකවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

13. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

14. විභාග ගාස්තුව රු. 800 කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට්පත, අයදුම්පතේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතුය. මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

15. විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන : ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සුදුසු මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ.

16. *විභාගයට ඇතුල්වීම* :
අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතුය.

***සටහන.***-අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවේ.

17. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :
විභාග ශාලාවේ දී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(*ආ*) තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත,
(*ඇ*) වලංගු ගමන් බලපත්‍රය.

18. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :
අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එහි සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු/ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

19. *භාෂා මාධ්‍යය* :
මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර, අයදුම්කරුවන්ට කැමති මාධ්‍යකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

20. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් තීරණය කෙරෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2017 මාර්තු මස 23 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා වන විවෘත තරග විභාගය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(දෙන ලද කොටු තුළ සංකේත අංක යොදන්න)

01. 1. මුලකුරු සමග නම :
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (පැහැදිලි අකුරෙන්)
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

02. (i) ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරෙන්) :————.
(ii) ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F)

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)

(5) ජන වර්ගය :
(සිංහල - 1, ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2, මුස්ලිම් - 3, ඉන්දියානු ද්‍රවිඩ - 4, බර්ගර් - 5, මැලේ - 6, වෙනත් - 7)

(6) (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
(iii) දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

(7) පුරවැසිභාවය :

පරම්පරාවෙන් :

ලියාපදිංචි වීමෙන් :

(8) ජාතික හැඳුනුම්පත් අංකය :————.

(9) (i) උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ii) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :
වර්ෂ :————. මාස :————. දින :————.

10. අධ්‍යාපන සුදුසුකම් :————.

(i) අ. පො. ස. (සා. පෙළ.) පළමුවර :
1. විභාග වර්ෂය හා මාසය :————.
2. අයදුම්කරුගේ විභාග අංකය :————.
3. සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(ii) අ. පො. ස. (සා. පෙළ.) දෙවනවර :
1. විභාග වර්ෂය හා මාසය :————.
2. අයදුම්කරුගේ විභාග අංකය :————.
3. සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

11. වෙනත් සුදුසුකම් :————.

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් : නැත :

'ඔව්' නම් විස්තර සඳහන් කරන්න. :————.

(13) මුදල් ගෙවන ලද මිනින්දෝරු කාර්යාලය :

රිසිට්පත් අංකය :————.
මුදල් ගෙවන ලද දිනය :————.

(14) අයදුම්කරුගේ සහතිකය ：
(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශ අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව දැන සිටිමි.
(ඇ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.
(ඈ) රු. ............ ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා ඇත.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ：
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන්නාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

| (කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.) |
|---|

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ：
තෝරාගනු ලැබුවහොත් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

උපලේඛනය 1

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 06.1 හි සඳහන් ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| | *නගරය/දිස්ත්‍රික්ක නාම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|---|
| 1. | කොළඹ | 01 |
| 2. | ගම්පහ | 02 |
| 3. | කළුතර | 03 |
| 4. | මහනුවර | 04 |
| 5. | මාතලේ | 05 |
| 6. | නුවරඑළිය | 06 |
| 7. | ගාල්ල | 07 |
| 8. | මාතර | 08 |
| 9. | හම්බන්තොට | 09 |
| 10. | කුරුණෑගල | 10 |
| 11. | පුත්තලම | 11 |
| 12. | අනුරාධපුර | 12 |
| 13. | පොළොන්නරුව | 13 |
| 14. | බදුල්ල | 14 |
| 15. | මොණරාගල | 15 |
| 16. | රත්නපුර | 16 |
| 17. | කෑගල්ල | 17 |
| 18. | අම්පාර | 18 |
| 19. | මඩකළපුව | 19 |
| 20. | ත්‍රිකුණාමලය | 20 |
| 21. | යාපනය | 21 |
| 22. | වවුනියාව | 22 |

04-135/1

---

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම
සඳහා
පවත්වනු ලබන සීමිත තරග විභාගය

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1

| *බඳවා ගන්නා තනතුර* | *පුරප්පාඩු ගණන* | *ශ්‍රේණිය* |
|---|---|---|
| මැනුම් උපකරණ කාර්මික ශිල්පී | 01 | III ශ්‍රේණිය |

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය
- මිනුම් කටයුතුවලට අදළ උපකරණ හා මෙවලම් නඩත්තු කිරීම හා සේවා කිරීම

2.0 පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප ：-

වගුව - අංක 01 -

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු. 29,840 - 10 x 300 - 11 x 350 - -10 x 560 - 10 x 660 - රු. 48,890 (එම්ටී 1 - 2016) | රු. 29,840 |
| II ශ්‍රේණිය | මාසිකව රු. 29,840 - 10 x 300 - 11 x 350 -10 x 560 - 10 x 660 - රු. 48,890 (එම්ටී1-2016) | රු. 33,190 |
| I ශ්‍රේණිය | මාසිකව රු. 29,840 - 10 x 300 - 11 x 350 -10 x 560 - 10 x 660 - රු. 48,890 (එම්ටී 1 - 2016) | රු. 37,250 |

- මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වන අතර රා. ප. ච. 03/2016හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

4.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සුදානම්ව සිටිය යුතු ය.

5.0 සුදුසුකම් ：
5.1 අධ්‍යාපන සුදුසුකම් ：
අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් තුනක් (03) ක් සමඟ විෂයන් පහක් (05) එකවර සමත්ව තිබීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයක් (06) ක් සමත්වී තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් ：
රජය පිළිගත් කාර්මික විදුහලකින් ඉලෙක්ට්‍රොනික හෝ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව එක් අවුරුදු පාඨමාලා-වක් හදරා තිබීම.

5.3 පළපුරුද්ද ：
අදළ ක්ෂේත්‍රයේ වසර 06ක පලපුරුද්දක් ලබා ඇති දෙපාර්තමේන්තු සේවකයෙක් වීම.
5.4 කායික සුදුසුකම් ：
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
5.5 වෙනත් ：
තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

සටහන ：
සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 සාවද්‍ය තොරතුරු සැපයීම ：
මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගෙ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන්කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

7.0 විභාග පරිපාටිය ：
විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය | කාලය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100% | 40% | පැය 01 |
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100% | 40% | පැය 02 |

8.0 තේරීම් පරිපාටිය ：
8.1 සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රථිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

09.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම ：

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතු ය. අංක 01 සිට 05 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 06 - 09.1 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 09.2 - 12 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 13 - 15 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද ඇතුළත්වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.
(ආ) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ඉල්ලුම්කරුවන් අයදුම්පත් සිය ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය.
(ඇ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.
(ඈ) නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

09.1 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ ''**මැනුම් උපකරණ කාර්මික ශිල්පී - සීමිත තරග විභාගය**'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

10.0 විභාග ගාස්තු ：
විභාග ගාස්තුව රු. 300 කි. මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපා-ර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය, දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 අයදුම්පත්‍ර යොමු කිරීම ：

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017.05.07 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
සර්වේයර් ජනරාල්,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 506,
කොළඹ.

12.0 විභාගයට පෙනී සිටීම ：
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

13.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව ：
විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2017 මාර්තු මස 23 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටු තුළ අංක යොදන්න.)

02. 1. මුලකුරු සමග නම ：
(i) සිංහලෙන් :—————.
(ii) ඉංග්‍රීසියෙන් :—————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්)
(i) සිංහලෙන් :—————.
(ii) ඉංග්‍රීසියෙන් :—————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.

04.1 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :
වර්ෂ :————. මාස :————. දින :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) ☐

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

06.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය : ☐ දිස්ත්‍රික්කයේ නම : ☐

06.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවද සිට ද ? :————.

07. වෘත්තීය සුදුසුකම් :————.

07.1 පළපුරුද්ද :————.

08. 08.1 දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු තනතුර හා දිනය :————.
08.2 සේවක අංකය :————.
08.3 එම තනතුරේ සේවය ස්ථිර කර තිබේ ද? :————.
08.4 සේවා කාලය තුළ විනය දඬුවම් ලබා තිබේ ද? :————.

08.4.1. පිළිතුර 'ඔව්' නම් ඒ පිළිබඳ තොරතුරු :————.

08.5 ආරම්භක තනතුරෙන් පසු වෙනත් තනතුරුවලට පත් වී තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු :

| *තනතුර* | *පත් වූ දිනය* | *සේවයේ ස්ථිරත්වය* |
|---|---|---|
| | | |

09. අධ්‍යාපන සුදුසුකම් :

09.1 අ. පො. ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

09.2 අ. පො. ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර :

දෙවනවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :—

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

10. වෙනත් සුදුසුකම් :————.

11. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් ☐ නැත ☐

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශ අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) රු. …………ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඒ සඳහා වෙන් ඇති ඇති ස්ථානයේ අලවා ඇත.
(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………………………… නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ………… දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :
නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කරන ලදී. ඔහු/ඇය විසින් මෙහි අංක 08 සහ 09 ශීර්ෂ යටතේ ලබාදී ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් වත්මත් තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

## උපලේඛනය 1

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 06.1 හි සඳහන් ලිපිනය අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| | නගරය/දිස්ත්‍රික්ක නාම | නගර/දිස්ත්‍රික්ක අංකය |
|---|---|---|
| 1. | කොළඹ | 01 |
| 2. | ගම්පහ | 02 |
| 3. | කළුතර | 03 |
| 4. | මහනුවර | 04 |
| 5. | මාතලේ | 05 |
| 6. | නුවරඑළිය | 06 |
| 7. | ගාල්ල | 07 |
| 8. | මාතර | 08 |
| 9. | හම්බන්තොට | 09 |
| 10. | කුරුණෑගල | 10 |
| 11. | පුත්තලම | 11 |
| 12. | අනුරාධපුර | 12 |
| 13. | පොළොන්නරුව | 13 |
| 14. | බදුල්ල | 14 |
| 15. | මොණරාගල | 15 |
| 16. | රත්නපුර | 16 |
| 17. | කෑගල්ල | 17 |
| 18. | අම්පාර | 18 |
| 19. | මඩකළපුව | 19 |
| 20. | ත්‍රිකුණාමලය | 20 |
| 21. | යාපනය | 21 |
| 22. | වවුනියාව | 22 |

04-135/2

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 II

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පැවැත්වේ.

1. ආයුර්වේද කොමසාරිස් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

2. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට අනුකූලව සකස් කර එවිය යුතුය. එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු අතර, එම අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් 2017.04.27 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (II)" යනුවෙන් සඳහන් විය යුතුය. අයදුම්පත්‍රය කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමුවරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 200 ක් වටිනා මුද්දර ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේනම් රු. 50 ක් බැගින් වටිනා මුද්දර ද අයදුම්පතෙහි අලවා තම අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය. මොනම කරුණක් යටතේ වුවද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :
අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී සහ පෙනී සිටින සෑම විෂයයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

4. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් අත්සන නියමිත පරිදි සහතික කරවා ගන්නා ලද ප්‍රවේශ පත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට (07) පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමඟ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතුය.

(i) විභාගයේ නම :
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම
(iii) අයදුම්කරුගේ ලිපිනය
(iv) අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනය

5. විභාග පරිපාටිය :
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව)

I මුදල් රෙගුලාසි - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්—
(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i වැනි කාණ්ඩය (10 පරිච්ඡේදය හැර)

II ආයතන සංග්‍රහය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමුවැනි කාණ්ඩයේ I, II, III, IV, V VI, VII, VIII, XII, XIII, XIV, XXIII, XXVII, XXIX, XXX, XXXII පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය පිළිබඳ දැනුම.
(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවැනි කාණ්ඩයේ XLVII සහ XLVIII පරිච්ඡේද.

III ආරෝග්‍යශාලා පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්—

(i) ආරෝග්‍යශාලා පිළිබඳ පැවැත්වෙන සාමාන්‍ය නීති රීති
(ii) ආරෝග්‍යශාලාව පිරිසිදුව තබා ගැනීම
(iii) රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නීති රීති
(iv) රෝගීන්ට නියමිත ආහාරපාන ලබා ගන්නා විධි
(v) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය
(vi) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති
(vii) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය
(viii) ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු
(xi) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි
(x) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් පිළිබඳ නීතිරීති
(xi) ආයුර්වේද කාර්ය සංවිධාන සංග්‍රහය

IV. රාජ්‍ය භාෂා වාචික පරීක්‍ෂණය - සිංහල/දෙමළ (විනාඩි 15)

(i) සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා—

(අ) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම.
(ආ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.
(ඇ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

(ii) දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා—

(අ) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම.
(ආ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම.
(ඇ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය.

ඒ. එම්. කේ. කේ. අත්තනායක,
ලේකම් (වැ. බ.) ,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2017 මාර්තු මස 24 වැනි දින,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

**ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2016 (II)**

විභාග අංකය : ☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐

(අදාළ අක්‍ෂරය කොටුව තුළ ලියන්න)
සිංහල - S දෙමළ - T

01. මුලකුරු සමඟ නම (Mr./Mrs./Miss) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
02. මුලකුරු සමග නම :————. මයා/මිය/මෙනවිය
(සිංහලෙන්/දෙමළෙන්)
03. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(සිංහළෙන්/දෙමළෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. (i) සේවා ස්ථානය හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ii) සේවා ස්ථානය අයත් පළාත :————.

07. (i) සේවා ස්ථානය හා ලිපිනය :————.
(සිංහළෙන් හෝ දෙමළෙන්)
(ii) දුරකථන අංකය :————.

08. (i) දැනට දරන තනතුර :————.
(ii) පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/විෂයයන්

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබ මින් ඉහත විභාගයකදී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයක් හෝ සමත් වී තිබේද? මුදල් රෙගුලාසි/ආයතන සංග්‍රහය/ආරෝග්‍යශාලා පරිපාලනය/වාචික පරීක්‍ෂණය (දෙමළ/සිංහල) එසේ නම් විභාග අංකය, වර්ෂය සහ මාසය සඳහන් කරන්න.

| විෂයය | විභාග අංකය | වර්ෂය සහ මාසය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ? :————.

විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් අලවන ලද මුද්දරවල වටිනාකම.

මුද්දර කොටුව :

සම්පූර්ණ විභාගය සඳහා රු. 200 ක් වටිනා මුද්දර ද, එක් එක් විෂයයක් සඳහා නම් රු. 50ක් බැගින් වටිනා මුද්දර ද මෙහි අලවන්න.

සංලක්‍ෂ්‍යය.— අපේක්‍ෂකයින්/අපේක්‍ෂිකාවන් නියමිත වටිනාකමින් යුත් මුද්දර ඔහුගේ/ඇයගේ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එකපිට එක නොඇලවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි අලවා ඇති රු. ...... ක මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත් සහතික කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිබඳව මම එකඟ වෙමි.

————,
අපේක්‍ෂකයාගේ/අපේක්‍ෂිකාවගේ අත්සන.

දිනය :————.

**සටහන.**— තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...................... මහතා/ මහත්මිය/ මෙනවිය ........... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

04-93

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ උතුරු දිස්ත්‍රික්කය සඳහා දුම්රිය පීලි අතරට යොදන කුඩා ගල් කියුබ් 2800 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන් වෙත දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් 2017.05.04 වැනි දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු ඇගයීමට ලක්කොට පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රදනය කරනු ලැබේ.

| අයිතම අංකය | ස්ථානය | කියුබ් | ගෙනැවිත් භාර දිය යුතු කාල සීමාව |
|---|---|---|---|
| 1. | පූනාව අංගනය | 300 | මාස 02 යි |
| 2. | තාන්ඩිකුලම් අංගනය | 500 | මාස 03 යි |
| 3. | 164m.10ch (වව්නියාව - ඕමාන්තායි අතර) | 1000 | මාස 05 යි |
| 4. | ඕමාන්තායි අංගනය | 1000 | මාස 05 යි |

02. ආපසු ගෙවනු නොලබන රු. 5,000.00 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තු ගෙවීමෙන් අනතුරුව 2017.05.03 දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2017.05.04 වැනි දින ප. ව. 2.00 ට අවසන් කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 94(11) 2438078 /94(11) 2436818 |
| ෆැක්ස් | : | 94(11) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7463

04-102

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

පහළ දිස්ත්‍රික්කය සඳහා දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් කියුබ් 1,700ක් ප්‍රසම්පාදනය කිරීම

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන් වෙත දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු ඇගයීමට ලක්කොට පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රදනය කරනු ලැබේ.

| | ස්ථානය | කියුබ් | ගෙනැවිත් භාර දිය යුතු කාලය (මාස) |
|---|---|---|---|
| 1. | අංක 1 දුම්රිය නැවතුම් පොළ සහ උතුරු කළුතර දුම්රිය ස්ථාන අතර | 1000 | 06 |
| 2. | උතුරු කළුතර දුම්රිය ස්ථාන සහ දකුණු කළුතර දුම්රිය ස්ථාන අතර | 500 | 03 |
| 3. | දකුණු කළුතර දුම්රිය ගබඩා ප්‍රදේශය | 200 | 02 |

02. ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2017.04.26 වැනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2017.04.27 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී නොමිලේ පරික්ෂා කර බැලිය හැක.

| | | |
|---|---|---|
| දුරකතන අංක | : | 94(11) 2438078/94(11) 2436818 |
| ෆැක්ස් අංකය | : | 94(11) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7472

04-103/1

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඇණ මුරිච්චි 56,000 ක් හා ස්ප්‍රිං වොෂර් 100,000 ක් ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : .SRS/F. 7447.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඇණ මුරිච්චි 56,000 ක් හා ස්ප්‍රිං වොෂර් 100,000 ක් ප්‍රසම්පාදනය සඳහා දේශීය නිෂ්පාදකයින් වෙතින්, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාර ගැනීම 2017.05.03 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

03. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලෙන්, 2017.05.02 වැනි දින පස්වරු 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවන ගාස්තුව රුපියල් 4,000 ක් ගෙවිය යුතුය.

04. මෙම ඇණ මුරිච්චි හා ස්ප්‍රිං වොෂර් නිෂ්පාදනය ගැණුම්කරු හට පිළිගත හැකි, ISO 9001:2008 හෝ සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතිලත් ආයතන විසින් කළ යුතුය.

05. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

06. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාර දීමෙන් ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ. පෙ. 1347,
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ලංසු ලේඛන නොමිලේ පරීක්ෂාකොට බැලිය හැකි අතර වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් පරිදි ලබාගත හැකිය :

දුරකථන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F, 7447

04-101/1

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**2017 -2018 වර්ෂය සඳහා බර කිරීමේ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් පත්කිරීම**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් දුම්රිය සේවය සඳහා 2017 -2018 වර්ෂය සඳහා, බර කිරීමේ කාර්ය ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් පත්කිරීම පිණිස, ප්‍රසිද්ධ සංවිධාන වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාර ගැනීම 2017.04.28 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක් ගෙවීමෙන් , 2017.04.27 වැනි දින පස්වරු 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාර ගැනීමේ අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තබන ලද ලංසු, ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දීමෙන් පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුරකතන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7437

04-101/2

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ තෝරාගත් දුම්රිය ඇන්ජිම් සඳහා සිද්ධීන් පටිගත කිරීමේ පද්ධතියක් (Event Recorder System) සහ සුපරීක්ෂාකාරී පාලන පද්ධතියක් (Vigilance Control System) සැලසුම් කොට, නිෂ්පාදනය කොට, ස්ථාපනය කොට ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7253

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දුම්රිය සේවය සඳහා සිද්ධීන් පටිගත කිරීමේ පද්ධතියක් හා සුපරීක්ෂාකාරී පාලන පද්ධතියක් සැලැසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් සහ අනෙකුත් හැකියාව සහිත සංවිධානවලින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාර ගැනීම 2017.05.31 වැනි දින ප.ව. 2.00ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ශ්‍රී ලංකා රුපියල් විසි දහසක (රු. 20,000.00) ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.03.21 වැනි දින සිට 2017.05.30 වැනි දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සහ ප. ව. 3.00 අතර ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් ලංසු ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘතිවල ලංසු ඉදිරිපත් කළ යුතුයි. විදේශීය ලංසුකරුවන් එම කාලසීමාව තුළදී ශ්‍රී ලංකා රුපියල් විසි දහසකට (රු.20,000.00) සමාන මුදලක් පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් එතෙර ශ්‍රී ලංකා දූත කාර්යාල වෙත ගෙවා ලංසු ලිපිලේඛන එවන මෙන් ශ්‍රී ලංකා දූත කාර්යාල මගින් ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී වෙතින් ඉල්ලීමක් කළ හැක. ශ්‍රී ලංකා රුපියල් විසි දහස (රු. 20,000.00) වන ප්‍රසම්පාදන ගාස්තුව (හෝ පරිවර්තන කළ හැකි සමාන වටිනා කමැති විදේශ මුදල් වර්ගය) ආපසු ගෙවනු නොලැබේ.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍ර තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.
දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347
ඕල්කොට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.

දුරකතන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7253

04-94

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

EN 45 E1 දුම්රිය මාර්ගයට සුදුසු වන පරිදි දුම්රිය ස්ථාන දෙක ඇතුළුව කන්තලේ සහ තම්පලාගමුව දුම්රිය ස්ථාන දෙක අතර යෙදීම සඳහා කොන්ක්‍රීට් සිල්පරම් කොට 8000ක් සැපයීම් සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7475

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දුම්රිය ස්ථාන දෙක ඇතුළුව කන්තලේ සහ තම්පලාගමුව දුම්රිය ස්ථාන අතර යෙදීම් සඳහා කොන්ක්‍රීට් සිල්පරම් කොට 8000ක් මිලදී ගැනීම සඳහා දේශීය නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.05.05 වැනි දින ප.ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු 15,200.00 ක ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.03.21 වැනි දින සිට 2017.05.04 වැනි දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන්හි 9.00 පැය හා 15.00 පැය අතර, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට මාවත දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍ර තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

දුරකථන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044.
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංකය : SRS/F. 7475

සභාපති,
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-95

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ගල්ඔය හා පොළොන්නරුව දුම්රිය ස්ථාන අතර (එම දුම්රිය ස්ථාන ද ඇතුළත්ව) මාර්ගය සඳහා, EN 45 E1 රේල් සීට් සඳහා ගැළපෙන කොන්ක්‍රීට් සිල්පර 5,000 ක් සැපයීම් සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7474

01. ශ්‍රී ලංකාවේ, කෙළඹ 10, ඕල්කට් මාවතේ තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ගල්ඔය හා පොළොන්නරුව දුම්රිය ස්ථාන අතර (එම දුම්රිය ස්ථාන ද ඇතුළත්ව) මාර්ගය සඳහා කොන්ක්‍රීට් සිල්පර 5,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍ර තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.04.25 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) පස්වරු 2.00 ට අවසන් කරනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු රුපියල් 11,500.00ක් ගෙවීමෙන් 2017.03.20 දින සිට 2017.04.24 වැනි දින දක්වා, සමාන්‍ය රාජකාරි දිනවල 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍ර තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ඒ සඳහා තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන් හෝ ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර පහත සඳහන් අය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347,
ඕල්කට් මාවත,
කොළඹ 10.

දුරකතන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818 ,
ෆැක්ක් අංකය : 94(11) 2432044,
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7474

04-96

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**රුමේනියානු දුම්රිය මැදිරි සඳහා LOW FRICTION COMPOSITE BRAKE BLOCKS 12,000 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7465

01. ශ්‍රී ලංකාව, කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත LOW FRICTION COMPOSITE BRAKE BLOCKS 12,000 ක් සැපයීම් සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍ර තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින් තම ලංසු ඇටෝර්නි බලය මගින් බලය පවරන ලද බලයලත් ඒජන්ත කෙනකු මගින් ඉදිරිපත් කළ හැකිය.

02. ලංසු භාරගැනීම 2017.05.30 වෙනි දින ප.ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 4,000.00 ක් පමණක් වන ප්‍රසම්පාදන ගාස්තුව ශ්‍රී ලංකා මුදලින් හෝ පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමකින් යුත් මුදලක් ගෙවීමෙන් අනතුරුව 2017.05.29 වෙනි දින ප.ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ එතෙර ශ්‍රී ලංකා දූත කාර්යාලවලින් ලබාගත හැකි ලංසු ලිපිලේඛනවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍ර තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10. ශ්‍රී ලංකාව

06. ශ්‍රී ලංකා කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347,
ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංකය : SRS/F. 7465

සභාපති
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-97

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කොළඹ අංගනයේ සහ රත්මලාන අංගනයේ ඇති යකඩ යතු කුඩු (Iron Shavings) මිලදී ගෙන ඉවත් කිරීම**

ප්‍රසම්පාදන අංකයඃ SRS/F.7462

01. ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වසරක කාලයක් පුරා දුම්රිය කොළඹ අංගනයේ සහ රත්මලාන අංගනයේ එකතු වූ යකඩ යතු කුඩු මිලදී ගෙන ඉවත්කර ගැනීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම (ශ්‍රී ලංකා වේලාවෙන්) 2017.04.21 වෙනි දින ප.ව. 2.00ට අවසාන කරනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක් (රුපියල් තුන්දහසක්) පමණක් වන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.04.20 වෙනි දින ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ.පෙ. 1347,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ:
දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10.
ශ්‍රී ලංකාව.

දුරකථන අංක: 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකය: 94(11)2432044
ඊමේල් : srs.sl@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය: SRS/F.7462

04-105

---

යොමු අංකය: SRS/F.7437

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මාර්ග නඩත්තුව සඳහා Rail Drilling යන්ත්‍ර 25 ක්, Rail Cutting යන්ත්‍ර 25 ක්, Sleeper Boring යන්ත්‍ර 25 ක් සහ Coach Screwing යන්ත්‍ර 10 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

01. ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මාර්ග නඩත්තුව සඳහා Rail Drilling යන්ත්‍ර 25 ක්, Rail Cutting යන්ත්‍ර 25 ක්, Sleeper Boring යන්ත්‍ර 25 ක් සහ Coach Screwing යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.05.26 වෙනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 2.00ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 10,000.00 ක් පමණක් හෝ පහසුවෙන් පරිවර්තනය කළ මුදල් වර්ගයකින් ඒ හා සමාන මුදල ලිපිලේඛන ගාස්තුව වශයෙන් ගෙවීමෙන් අනතුරුව 2017.05.25 වෙනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය හෝ එතෙර ශ්‍රී ලංකා දූත කාර්යාල වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ.පෙ. 1347,
ඕල්කට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ:

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකය: 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය: SRS/F.7451

04-104

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් කියුබ් 1,850 ක් ප්‍රසම්පාදනය කිරීම**

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන් වෙත දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩාගල් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු ඇගයීමට ලක්කොට පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රදානය කරනු ලැබේ.

| | ස්ථානය | කියුබ් | ගෙනවිත් භාරදිය යුතු කාලය (මාස) |
|---|---|---|---|
| 1. | CEW අංගනය | 100 | 02 |
| 2. | බුළුගහගොඩ දුම්රිය අංගනය | 50 | 01 |
| 3. | වේයන්ගොඩ 1PW අංශය (19m 22C Dn) | 50 | 01 |
| 4. | වේයන්ගොඩ 1PW අංශය (20m 63C Dn) | 150 | 02 |
| 5. | වේයන්ගොඩ 1PW අංශය (21m 25C Dn) | 50 | 01 |
| 6. | වේයන්ගොඩ 1PW අංශය (22m 40C Up) | 250 | 03 |
| 7. | වේයන්ගොඩ 1PW අංශය (25m 73C Dn) | 200 | 03 |
| 8. | වේයන්ගොඩ 1PW අංශය (25m 73C Up) | 200 | 03 |
| 9. | හලාවත දුම්රිය අංගනය | 300 | 03 |
| 10. | නාත්තන්ඩිය දුම්රිය අංගනය | 250 | 03 |
| 11. | ලුණුවිල දුම්රිය අංගනය | 250 | 03 |

02. ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.04.25 වෙනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2017.04.26 වෙනි දින ප.ව. 2.00ට අවසාන කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකය : 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),

ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය: SRS/F.7468

04-103/2

---

# බඩු බාහිරාදිය විකිණීම්

**සබරගමුව පළාත්බද ඇඹිලිපිටිය මහාධිකරණයේ අවසන් නඩුවලට අදළ නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අවසන් නඩුවලට අදළ නඩු භාණ්ඩ 2017.05.03 වැනි බදාදා පෙ. ව. 10.00 ට ඇඹිලිපිටිය මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීමට ප්‍රථම පැය 1/2කට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. මෙම භාණ්ඩ මිලදී ගන්නා අය මුදල් ගෙවා රිසිට්පත ලබාගෙන මිලදී ගත් භාණ්ඩ එදිනම, අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. තවද, එම භාණ්ඩ මිලදී ගන්නා අය ස්වකීය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, ගෙවීම් සඳහා චෙක්පත්, මුදල් ඇණවුම් කිසිවක් භාර නොගන්නා බවද, මෙයින් දැනුම් දෙමි.

කුමාරි එම්. අබේරත්න,
මහාධිකරණ විනිසුරු,
සබරගමුව පළාත්බද මහාධිකරණය,
ඇඹිලිපිටිය.

2017 මාර්තු 21 වැනි දින,
ඇඹිලිපිටිය මහාධිකරණයේ දී ය.

වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලේඛනය

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | HCE 43/14 (මහේ/අධි/අංක බී ආර්. 348/09) | ත්‍රීරෝද රථයක කික් හැඩලය |
| 02. | HCE 98/13 (මහේ/අධි/අංක 26234/09) | 1. පොඩි කතුරු 01යි<br>2. කළු පටි සහිත අත් ඔරලෝසු 01යි |
| 03. | HCE 90/13 (මහේ/අධි/අංක බී ආර්. 1604/11) | N 91 වර්ගයේ ජංගම දුරකථනය |
| 04. | HCE 81/14 (මහේ/අධි/අංක 89281/13 NS ) | Forme වර්ගයේ ජංගම දුරකථනය |
| 05. | HCE 58/15 (මහේ/අධි/අංක බී ආර්. 662/13) | WPQM 7976 දරන කොළපාට ත්‍රීරෝද රථය |
| 06. | HCE 59/15 (මහේ/අධි/අංක බී ආර්. 1675/13) | SGVH 4051 දරන ඩිස්කවරි යතුරු පැදිය හා ස්විච් යතුර |
| 07. | HCE 76/14 (මහේ/අධි/අංක බී ආර්. 521/14) | NC XK 8617 දරන යතුරු පැදිය (බැටරිය රහිත) |
| 08. | HCE 42/13 (මහේ/අධි/අංක බී ආර්. 264/09) | කැත්තක් |
| 09. | HCE 29/16 (මහේ/අධි/අංක බී ආර්. 606/12) | යකඩ ඉන්නක්. |

04-197

---

**ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය මහෙස්ත්‍රාත් අධිකරණය - අනුරාධපුර**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හිමිකම් නොපාන ලද නඩු අංක මැකී ඇති නඩු වාර්තා සොයා ගැනීමට අපහසු භාණ්ඩවල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2017.04.29 වැනි දින පෙ. ව. 10.00 ට අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

4. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු බවත්, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

6. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

7. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන්වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

8. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

කේ. පී. එස්. හර්ෂන්,
මහෙස්ත්‍රාත් /අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අනුරාධපුර.

2017 මාර්තු මස 10 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 44421 | කැති 07 යි |
| 2. | 61469 | කැති 01 යි |
| 3. | 61467 | කැති 01 යි |
| 4. | 61466 | කැති 01 යි |
| 5. | 57290 | කැති 01 යි |
| 6. | 51689 | කැති 01 යි |
| 7. | 57291 | කැති 01 යි |
| 8. | 61465 | කැති 01 යි |
| 9. | 56209 | කැති 01 යි |
| 10. | 45209 | කැති 01 යි |
| 11. | 45540 | කැති 01 යි |
| 12. | 46845 | කැති 01 යි |
| 13. | 46844 | කැති 01 යි |
| 14. | 46842 | කැති 01 යි |
| 15. | 46132 | කැති 01 යි |
| 16. | 42185 | කැති 01 යි |
| 17. | 45539 | කැති 01 යි |
| 18. | 42187 | කැති 01 යි |
| 19. | 56208 | කැති 01 යි |
| 20. | 56210 | කැති 01 යි |
| 21. | 40179 | කැති 01 යි |
| 22. | 56640 | කැති 01 යි |
| 23. | 47640 | කැති 01 යි |
| 24. | 56603 | කැති 01 යි |
| 25. | 72396 | කැති 01 යි |
| 26. | 62712 | කැති 02 යි |
| 27. | 72175 | කැති 04 යි |
| 28. | 57303 | කැති 01 යි |
| 29. | 60495 | කැති 01 යි |
| 30. | 85780 | කැති 01 යි |
| 31. | 85514 | කැති 01 යි |
| 32. | 72643 | කැති 01 යි |
| 33. | 85514 | කැති 01 යි |
| 34. | 85504 | කැති 02 යි |
| 35. | 73717 | කැති 01 යි |
| 36. | 88922 | කැති 01 යි |
| 37. | 90450 | කැති 01 යි |
| 38. | 78565 | කැති 01යි, පොරොව 01යි |
| 39. | 57733 | පොරොව 01යි |
| 40. | 46647 | පොරොව 01යි |
| 41. | 42186 | පොරොව 01යි |
| 42. | 47375 | පොරොව 01යි |
| 43. | 72395 | පොරොව 01යි |
| 44. | 38905 | පොරොව 01යි |
| 45. | 80640 | පොරොව 01යි |
| 46. | 82848 | සවල් 01යි |
| 47. | 62714 | සවල් 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 48. | 57081 | සවල් 01යි |
| 49. | 72713 | සවල් 01යි |
| 50. | 65736 | සවල් 01යි |
| 51. | 70541 | සවල් 01යි |
| 52. | 77662 | සවල් 01යි |
| 53. | 78486 | සවල් 01යි |
| 54. | 78503 | සවල් 01යි |
| 55. | 83941 | සවල් 01යි |
| 56. | 84680 | සවල් 01යි |
| 57. | 90823 | සවල් 01යි, උදලු 01යි, යකඩ බාල්දි 01යි |
| 58. | 62449 | උදලු 01යි |
| 59. | 62905 | උදලු 01යි |
| 60. | 84666 | උදලු 01යි, තාච්චි 01යි |
| 61. | 88831 | පිහිය 01යි |
| 62. | 88695 | ඇලුමිනියම් මුට්ටි 01යි, ඇලුමිනියම් තාච්චි 01යි |
| 63. | 90822 | ඇලුමිනියම් කළ 01යි |
| 64. | 84552 | විදුලි පන්දම් 01යි |
| 65. | 84551 | විදුලි පන්දම් 01යි |
| 66. | 83011 | විදුලි පන්දම් 01යි |
| 67. | 85534 | විදුලි පන්දම් 01යි |
| 68. | 88046 | විදුලි පන්දම් 01යි |
| 69. | 85536 | විදුලි බේකර් 01යි |
| 70. | 88040 | විදුලි බේකර් 01යි |
| 71. | 84375 | විදුලි බේකර් 01යි |
| 72. | 89267 | විදුලි බේකර් 01යි |
| 73. | 87466 | දුරකථන චාජර් 01යි |
| 74. | 86064 | දුරකථන චාජර් 01යි |
| 75. | 89269 | දුරකථන චාජර් 01යි |
| 76. | 84547 | දුරකථන චාජර් 01යි |
| 77. | 89601 | වයර් කෝඩ් 01යි |
| 78. | 90475 | 12.5 Kg Litro වර්ගයේ ගෑස් සිලින්ඩර් 01යි, ගෑස් ලිප් 01යි |
| 79. | 83363 | Nokia වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 80. | A 1208/16 | ETEL වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| 81. | B 2596/04 | පාපැදි 01 යි |
| 82. | B 351/05 | පාපැදි 01 යි |
| 83. | B 2867/05 | පාපැදි 01 යි |
| 84. | B 3159/05 | පාපැදි 01 යි |
| 85. | B 1493/06 | පාපැදි 01 යි |
| 86. | B 958/06 | පාපැදි 01 යි |
| 87. | B 2112/06 | පාපැදි 01 යි |
| 88. | B 2038/06 | පාපැදි 01 යි |
| 89. | B 1337/06 | පාපැදි 01 යි |
| 90. | B 2608/07 | පාපැදි 03 යි |
| 91. | B 2368/07 | පාපැදි 01 යි |
| 92. | B 2039/07 | පාපැදි 01 යි |
| 93. | B 2045/07 | පාපැදි 01 යි |
| 94. | B 3102/07 | පාපැදි 01 යි |
| 95. | B 2214/07 | පාපැදි 01 යි |
| 96. | B 3040/07 | පාපැදි 01 යි |
| 97. | B 1282/08 | පාපැදි 01 යි |
| 98. | B 470/09 | පාපැදි 01 යි |
| 99. | B 2176/09 | පාපැදි 01 යි |
| 100. | B 331/09 | පාපැදි 01 යි |
| 101. | B 2884/03 | පාපැදි 01 යි |
| 102. | B 473/09 | පාපැදි 01 යි |
| 103. | 37130 | පාපැදි 03 යි |
| 104. | - | විවිධ ප්‍රමාණයේ හිස් ප්ලාස්ටික් බූලි 75ක් පමණ |
| 105. | - | විවිධ ප්‍රමාණයේ හිස් වීදුරු බෝතල් 500ක් පමණ |
| 106. | - | විවිධ ප්‍රමාණයේ හිස් යකඩ බැරල් 20ක් පමණ |
| 107. | 75023 | සවල් 01යි, පොරෝ 02යි, එල්ලෙන තරාදි 01යි , ප්ලාස්ටික් බැරල් 03යි |
| 108. | B 1102/07 | 31 ශ්‍රී 1371 දරන ජීප් රථය |
| 109. | B 1982/07 | ලි. ප. අංක රහිත Bajaj Pulser යතුරුපැදිය |
| 110. | B 1145/07 | ලි. ප. අංක MV 3161 දරන Bajaj CT 100 යතුරුපැදිය |
| 111. | B 2555/06 | ලි. ප. අංක 159-0598 දරන Yamaha යතුරු පැදිය |
| 112. | B 1130/08 | ලි. ප. අංක GF 6482 දරන Honda යතුරු පැදිය |
| 113. | B 2554/09 | ලි. ප. අංක JV - 3699 දරන Bajaj CT 100 යතුරු පැදිය |
| 114. | B 1336/09 | ලි. ප. අංක TS 6900 දරන Hero Honda යතුරු පැදිය |
| 115. | B 109/09 | ලි. ප. අංක TU 5101 දරන Hero Honda යතුරු පැදිය |
| 116. | B 3490/09 | ලි. ප. අංක JV - 3674 දරන Bajaj Discover යතුරු පැදිය |
| 117. | A 1142/09 | ලි. ප. අංක 132-6140 දරන Honda යතුරු පැදිය |
| 118. | A 574/08 | ලි. ප. අංක රහිත යතුරු පැදිය |
| 119. | A 1246/09 | ලි. ප. අංක 124-9359 දරන Yamaha Mate 50 යතුරු පැදිය |
| 120. | - | ලි. ප. අංක WC - 4248 දරන Bajaj Pulsar යතුරු පැදිය |
| 121. | 55267 | ලි. ප. අංක රහිත Singer Safari යතුරු පැදිය |
| 122. | 74879 | ලි. ප. අංක රහිත Kawasaki Baligo යතුරු පැදිය |
| 123. | B 1805/10 | ලි. ප. අංක 117-0956 දරන Yamaha Mate 50 යතුරු පැදිය |
| 124. | 45844 | ලි. ප. අංක 121- 2100 දරන Honda යතුරු පැදිය |
| 125. | B 545/08 | ලි. ප. අංක GL-6280 දරන Bajaj ත්‍රිරෝද රථය |
| 126. | 30858 | ලි. ප. අංක 41 ශ්‍රී 1394 දරන Isuzu ලොරි රථය |

04-09

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2017 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2017 මැයි මස 01 වැනි දින සිට 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සියලුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් ව 2017.04.28 වැනි දින පෙ.ව. 10.00 දක්වා ම විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද (අදාළ ටෙන්ඩරයේ සඳහන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක්) සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2017.04.28 වැනි දින පෙ.ව. 10.00 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2017 මාර්තු මස 22 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව රු. | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| මුකලන්ගමුව අංක 13 | කටාන | මුකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2017.04.28<br>පෙ.ව. 10.00 |

04-100

### වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වාකරේ සහ මාංකාඩු - මඩකලපුව දිස්ත්‍රික්කය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017 ජූලි 2018 ජූනි

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ මාංකාඩු රා තැබෑරුම් සඳහා 2017 ජූලි මස 01 වැනි දින සිට 2018 ජූනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මන්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සිය (රු. 1,500) ක මුදලක් වාකරේ ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබාගත හැකි ය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2017.04.24 දින සිට 2017.05.05 වැනි දින පස්වරු 3.00 දක්වා.

02. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් පත්‍ර සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබාගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන ලද දින සිට සති දෙකක් ඇතුලත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික නොමැත.

06. ලියාපදිංචි කළ පොල් සහ තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

ආර්. රාහුලනායගි,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මණ්මුනයි දකුණ එරුවිල් පත්තු.

2017 මාර්තු මස 17 වැනි දින,

රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය

| තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය | තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන | තැබෑරුම් අංකය | ටෙන්ඩර් දිනය | ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් වේලාව |
|---|---|---|---|---|
| කෝරලේපත්තු උතුර | පාල්සේනෙ | TT No. 5 | 2017.05.30 | ප. ව. 2.00ට |

සටහන .- 1. ටෙන්ඩර් මණ්ඩල 2017.05.30 වැනි දින පස්වරු 2.00 ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2017.06.16 වැනි දින පස්වරු 2.00 ට පැවැත්වේ.

04-116

# රජයේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව දැන්වීම

කොළඹ 15, මෝදර, මුතුවැල්ල මාවත, අංක 242/23/D හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 831520400 V දරන රාජමුනිදුගේ නිරන්ජන් ඩේව් වන මම ලක්ෂ්මි සී. සූරිගේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2017.02.27 වැනි දින සහතික කරන ලද අංක 8773 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් තලපත්පිටිය, පන්සල පාර, අංක 445/1A හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 782300342 V දරන හතුරුසිංහගේ රුවන් ඉන්දික ජයරත්න යන අයට මා වෙනුවෙන් ක්‍රියා කිරීමේ දී තිබූ ඇටෝර්නි බලය 2017.03.14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් එම ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිම ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ආර්. නිරන්ජන් ඩේව්.

04-04

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

රත්මලාන, ශ්‍රී ජිනරතන මාවත, අංක 8/4 හි පදිංචි සුනේත්‍රා පෙරේරා (ජා. හැ. අංක 456412890 V) සහ ෂෙහානි රද්දල්ගොඩ (ජා. හැ. අංක 736150816 V) වන අප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලබන්නේ රත්මලාන, 5 වන පටුමග, අංක 17 හි පදිංචි නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් රේණුකා එම්. එදිරිසිංහ විසින් 2013 දෙසැම්බර් මස 30 වැනි දින ලියා සහතික කරන ලද අංක 2353 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මාලඹේ, මිහිඳු මාවතේ, 9 වැනි පටුමග, අංක 559/4C හි පදිංචි ජානකී කහඳලියනගේ (ජානකී වීරසිංහ) (ජා. හැ. අංක 497592267 V) යන අය අපගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කරන ලද එකී ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් මින්මතුවට එහි නෛතික බලපැවැත්මක් නොමැති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා පෙරේරා,
ෂෙහානි රද්දල්ගොඩ.

04-13

### ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 06 වන දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඩ්‍රීම් වර්ල්ඩ් ට්‍රෙඩෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 120594
ලියාපදිංචි කල දිනය : 2017.03.06
ලියාපදිංචි කළ ලිපිනය : 17/A, පොලිස් ස්ථානය ඉදිරියෙහි වූ, මඩකලපුව පාර, පොළොන්නරුව.

04-15

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : හෙම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 120650
ලියාපදිංචි කාර්යාලය : අංක 65, මීගහවත්ත, සියඹලාපේ
ලියාපදිංචි කළ දිනය : 2017.03.08

සමාගමේ ලේකම්වරු.

04-23

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : පතිරණ ලෙන්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 85948,
දිනය : 2012.06.15
ලිපිනය : අංක 21, තිස්ස මාවත, කුලියාපිටිය.

කළමනාකරු.

04-29

---

**නිවේදනයයි**

එලිමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංක පී වී 60012) සමාගම විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වන වගන්තියට අනුකූලව සහ සමාගමේ කොටස් හිමියන් වෙත ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා සම්මතයට යටත්ව, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය පහත සඳහන් පරිදි අවකරණය කිරීමට යෝජිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම : රු. 140,476,706.86 සිට
රු. 103,649,275.86 දක්වා
අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා සම්මත දිනය : 2016.11.24
සමාගම් කොටස් හිමියන්ගේ ලිඛිත
යෝජනාවට නියමිත දිනය : 2017.03.31

එලිමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 22/2 - 1-1,
පෙරේරා මාවත, කළුබෝවිල,
දෙහිවල.

04-40

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියට අනුව පහත දක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නාමය : ඒ යූ එන්ටර්ටේන්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : අංක 112, රෝහල පාර, කළුබෝවිල, දෙහිවල
ලියාපදිංචි අංකය : PV 119844,
ලියාපදිංචි දිනය : 2017.02.03

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-51

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : හයි ක්ලෝතින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 120915
ලියාපදිංචි කාර්යාල ලිපිනය : කිරිබත්ගල එස්ටේට්, නිවිතිගල පාර, දැල, රත්නපුර.
සංස්ථාගත කළ දිනය : 2017.03.20

මොහොමඩ් ඉස්මයිල් ෆයිසාල්,
සමාගමේ ලේකම්.

04-52

---

**විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීම**

අංක 47, තිඹිරිගස්යාය පාර, කොළඹ 05 ලිපිනයේ පදිංචි ෆසල් මොහමඩ් අදාම් (ජාතික හැඳුනුම්පත් අංක 542141972 V) හනියා බිස්රි අදාම් (ජාතික හැඳුනුම්පත් අංක 585090174 X), ෆාතිමා ෂිරා අදාම් (ජාතික හැඳුනුම්පත් අංක 625240476V) වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් සුනේත්‍රා යූ. ආර්. වනිගසේකර විසින් ලියා සහතික කරන ලද අංක 4270 සහ 2005 නොවැම්බර් 11 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 32/2B, රූබෝට් උද්‍යානය, දෙහිවල දරන තැන පදිංචි නූර් මොහමඩ් මොහමඩ් ඉක්රම් (ජාතික හැඳුනුම්පත් අංක 552383192V) යන අය වෙත ලබා දී තිබූ විශේෂ ඇටෝර්නි බලය 2017.03.15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් එම විශේෂ ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන කිසිම ක්‍රියාවකට අප විසින් වග නොකියන බවටත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ෆසල් මොහමඩ් අදාම්,
හනියා බිස්රි අදාම්,
ෆාතිමා ෂිරා අදාම්.

04-66

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නාමය : විෂ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120657
ලියාපදිංචි ලිපිනය : අංක 160/285 A, වැව පාර, පැලවත්ත, තලංගම දකුණ.

සමාගම් ලේකම්.

04-75

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි.

නම : සෙරෙන්යා රීච් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 119513
දිනය : 2017.01.20
ලිපිනය : අංක 70/47, ශ්‍රී සිද්ධාර්ථ පාර, කිරුළපන, කොළඹ 05.

සමාගම් ලේකම්වරු.

04-82

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩී ඇන්ඩ් එස් කොමර්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 120639
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 400, රිවර්සයිඩ් වතුයාය,
ගලහ පාර, පේරාදෙනිය
ලියාපදිංචි දිනය : 2017.03.07

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

04-88

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆෝ ඒසස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 120575
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 498/4, හයිලෙවල් පාර,
පන්නිපිටිය
ලියාපදිංචි දිනය : 2017.03.06

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

04-87

---

**ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

කුණ්ඩසාලේ හේන්වල අංක 12/3 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 640421460 V දරන ප්‍රියානි දේවිකා ජයලත්, මහනුවර, දෙඩන්වල, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, අංක 224 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 610574084 V දරන ජයලත්ගේ උපාලි ප්‍රියන්ත කුමාර ජයලත් හෙවත් උපාලි ප්‍රියන්ත කුමාර ජයලත් සහ මහනුවර ශ්‍රී ධම්මදස්සී මාවත අංක 44/11 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 587042754 V දරන රම්‍ය ශාන්ති කුමාරි ජයලත් වන අප විසින් අත්සන් කරන ලද සහ අපගේ ඇටර්නි බලකරු වශයෙන් බත්තරමුල්ල පන්නිපිටිය පාර අංක 1060 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති හෝම් ලෑන්ඩ්ස් හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම පත් කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්න සී මිල්ලවිතානච්චි සහතික කරන ලද 2015 සැප්තැම්බර් මස 3 වැනි දින සහ අංක 2122 දරන ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයි ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටද එහි සියලුම මහජනයාට ද මෙයින් දන්වා සිටිමු.

04-98

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : පියෝ ග්‍රීන් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119522
ලියාපදිංචි ලිපිනය : අංක 3/106, ගැමුණුපුර 1 වන පටුමග,
කොතලාවල, කඩුවෙල

අධ්‍යක්ෂකවරු.

04-108

---

**වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන ඡේදය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ඒ එම් ටී මාකටිං ඇන්ඩ් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්)
ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 80761
දිනය : 2011 අගෝස්තු මස 19
සමාගමේ ලිපිනය : අංක 230 සහ 232, වුල්ෆෙන්ඩාල් වීදිය, කොළඹ 13.

අප්පුකුඩ්ඩි මුරුගේසු තානානයගම්,
අධ්‍යක්ෂ.

04-115

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව පහත සඳහන් සමාගම 2017 මාර්තු 14 වැනි දින සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සීෆෝස් ෆර්ටිලයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 120803
ලියාපදිංචි ලිපිනය : අංක 9/5, තම්බයියා ඇවනිව්, කොළඹ 07

ජේසී ඇන්ඩ් කොම්පැනි,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තම්බයියා ඇවනිව්,
කොළඹ 07.

04-118

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

හික්කඩුව, දහනායකගොඩ වත්ත, කන්ද උඩ පාර, 43/5 පදිංචි රණසිංහ වීරක්කොඩි ලීලාවතී වන මා විසින්, හික්කඩුව, වවුලාගොඩ පදිංචි චන්ද්‍රසේන ගොන්සල්කෝරාළ යන අය වෙත බලය පවරමින්, ප්‍රසිද්ධ නොතාරිස් රංජනී ඊ කළුපහන මහත්මිය විසින් වර්ෂ 2012.02.17 වැනි දින ලියා සහතික කරන ලද අංක 23287 දරන ඇටර්නි බලපත්‍රය 2017.02.16 දින සිට අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදුකරන කිසිදු ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙමි.

රණසිංහ වීරක්කොඩි ලීලාවතී.

04-120

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 17 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වී. එම්. මරයින් සර්විසර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 120925
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30/90 S, මලලසේකර
මාවත, ලොන්ඩන් පෙදෙස, කොළඹ 07

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

04-123

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 01 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : චලෝහි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 120449
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1174, ධම්මෝදය මාවත, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
හේවගේ පුණ්‍යා පත්මමාලි
සමාගමේ ලේකම්.

04-124

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 10 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : රේඩියස් ප්‍රමෝෂන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 120750
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 275, වන වාසළ පාර, කැලණිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

04-125

---

**විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙහිවල, නැදිමාල, පැපිලියාන පාරේ, අංක 17/1 දරන ස්ථානයේ පදිංචි මෝදරගේ සුදත් කුමාර පීරිස් (ජා. හැ. අංක 580661300 V) වන මා, මාගේ ඇටර්නි බලකරු ලෙස දෙහිවල, නැදිමාල, පැපිලියාන පාරේ අංක 17/1 දරන ස්ථානයේ පදිංචි අකරවිටගේ ජලිත චූලින්ද අකරවිට (ජා. හැ. අංක 891261985 V) යන අය කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එස්. වීරමන් මහතා විසින් 2009.06.12 වැනි දින ලියා සහතික කළ අංක 2366 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් කරන ලද පත්වීම අවලංගු කරන අතර, එකී ඇටර්නි බලපත්‍රය බලපැවැත්මක් හෝ ප්‍රතිඵල සහිත වීමක් නොවන බව සියල්ලෝම මෙයින් දැනගනිත්වා.

04-208

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන වගන්ති ප්‍රකාර පහත නම් සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : ලෝටස් මයික්‍රෝ ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්)
ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 120677
ලියාපදිංචි දිනය : 2017.03.08
ලිපිනය : අංක 257/4, පිටුවල්ගොඩ, යක්කල.

04-210

---

**ආර්. සී. එම්. ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම**

(ලි. ප. අංකය : පීවී 97282)

2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) වගන්ති ප්‍රකාරව දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 144(1) වගන්ති ප්‍රකාරව ඉහත නම සඳහන් සමාගමේ 2017ක් වූ මාර්තු මස 13 වැනි දින සාමාජිකයන් විසින් නිසි පරිදි සම්මත කරන ලද පහත සඳහන් විශේෂ/අතිවිශේෂ යෝජනා සම්මතය මෙයින් නිවේදනය කරනු ලැබේ.

විශේෂ/අතිවිශේෂ යෝජනා සම්මුතිය - සාමාජික ස්වේච්ඡා ගණන් බේරා වසා දැමීම

සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය යුතු බවත්, නුගේගොඩ, දෙල්කඳ, හයිලෙවල් ප්ලාසා ගොඩනැගිල්ලේ දෙවන මහලෙහි අංක 93 හි වරලත් ගණකාධිකාරිවරුන් වන සී. ජේ. ඇසෝසියේට්ස්හි වරලත් ගණකාධිකාරි නන්දෝරිස් කංකානම්ගේ චමින්ද ජයසංඛ පෙරේරා මහතා ඈවරකරු වශයෙන් පත්කර ගත යුතු බවත්, සම්මත ය.

ප්‍රිමියර් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 85 ඒ,
පරණ කැස්බෑව පාර,
රත්තනපිටිය,
බොරලැස්ගමුව.

04-137

---

**එන්. ඇන්ඩ් ආර්. නිෂ්පාදන (පුද්ගලික) සමාගම**

(ලි. ප. අංකය : පීවී 84357)

2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) වගන්ති ප්‍රකාරව දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 144(1) වගන්ති ප්‍රකාරව ඉහත නම සඳහන් සමාගමේ 2017ක් වූ මාර්තු මස 20 වැනි දින සමාජිකයන් විසින් නිසි පරිදි සම්මත කරන ලද පහත සඳහන් විශේෂ/අතිවිශේෂ යෝජනා සම්මතය මෙයින් නිවේදනය කරනු ලැබේ.

විශේෂ/අතිවිශේෂ යෝජනා සම්මුතිය - සාමාජික ස්වේච්ඡා ගණන් බේරා වසා දැමීම.

සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය යුතු බවත්, නුගේගොඩ, දෙල්කඳ, හයිලෙවල් ප්ලාසා ගොඩනැගිල්ලේ දෙවන මහලෙහි අංක 93 හි වරලත් ගණකාධිකාරිවරුන් වන සී. ජේ. ඇසෝසියේට්ස්හි වරලත් ගණකාධිකාරි නන්දෝරිස් කංකානම්ගේ චමින්ද ජයසංඛ පෙරේරා මහතා ඈවරකරු වශයෙන් පත්කර ගත යුතු බවත්, සම්මත ය.

ප්‍රිමියර් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 85 ඒ,
පරණ කැස්බෑව පාර,
රත්තනපිටිය,
බොරලැස්ගමුව.

04-138

---

**සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (2) වගන්තිය ප්‍රකාර දැන්වීම

සමාගමෙහි පෙර නම : වයිටලිටි ඩිස්කවර්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 86786
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 106, රීඩ් ඇවනියු, කොළඹ 04
සමාගමෙහි අලුත් නම : එකෝවේව් ඇප් (ප්‍රයිවට්) ලිමිටඩ්
නම වෙනස් කරනු ලැබූ දිනය : 2016.09.15

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
සමාගමේ ලේකම්.

2015 නොවැම්බර් මස 04 වැනි දින,
අංක 596/5, පත්තිනිවත්ත,
පෝරේ, අතුරුගිරිය.

04-139

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

නීර්වෙලි උතුර, නීර්වෙලි හි පදිංචි සුබ්‍රමනියම් සුබේන්දිරන් වන මම විසින් ලියා අත්සන් කරන ලද, හා නොතාරිස් බී. තවපාලන් විසින් යාපනය දී සහතික කරන ලද වර්ෂ 2012ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපපත්‍රය මගින් යාපනය, නීර්වෙලි උතුර, නීර්වෙලි හි පදිංචි කවීතා ප්‍රදීප් විවාහයට පෙර සුබ්‍රමනියම් (ජා. හැ. අ. 748500863 V) වෙත පවරන ලද විශේෂ ඇටෝර්නි බලය අවලංගු කොට එම ඇටෝර්නි බලපත්‍රය බල රහිත කරන බවත්, මින් ඉදිරියට වර්ෂ 2017ක් වූ ජනවාරි මස 17 වැනි දින සිට ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ජනරජයටත් , මහජනතාවටත් දන්වා සිටිමි.

සුබ්‍රමනියම් සුබෙන්දිරන්.

04-146

### ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

අංක 455, තිඹිරිගස්යාය පාර, කොළඹ 05 හි පදිංචි ඉනෝකා ප්‍රියංගනී වික්‍රමසිංහ වන මම, අංක 5311 දරන 2014.10.24 වැනි දින ශ්‍රී ලංකාවේ කොළඹ දී ලියාපදිංචි කළ මහ බ්‍රිතාන්‍යයේ අංක 15, ඇඩ්ස්වර්ත් පැරේඩ්, ගෝරිං බයි සී, බටහිර සසෙක්ස් BN 12 4UA හි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් ඇලිසන් මේරි එලනෝර් හිල් විසින් සකසන ලද සරා සිම් හා ඔනිවියා ස්මිත් යන අය සාක්ෂිකරුවන් වූ ශ්‍රී ලංකාවේ අංක 455, තිඹිරිගස්යාය පාර, කොළඹ 05 හි පදිංචි හේමමාලි ක්‍රිෂ්ණා රණතුංග (ජා. හැ. අංක 447192205 V) වෙත බලය පවරන ලද ඇටර්නි බලපත්‍රය අද දින සිට මුළුමනින් ම අවලංගු කර අහෝසි කරන බව ශ්‍රී ලංකා රජයටත් එහි මහජනතාවටත් මෙයින් සැල කර සිටිමි.

ඉනෝකා ප්‍රියංගනී වික්‍රමසිංහ.

2017 මාර්තු මස 09 වැනි දින.

04-167

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගාල්ල නගර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතරේ මහ නගර සභා සීමාව තුළ ගාල්ල කඩවත් සතරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුවැල්ල 96 සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුඹල්වැල්ල ගමේ හි පිහිටි මහනගර සභා වරිපනම් අංක 75 දරන ලොට් B ඔටියාපරංගිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. වීරසූරිය විසින් 2011 නොවැම්බර් මස 03 වැනි දින සහ 2012 පෙබරවාරි මස 10 වැනි දින මැන සාදන ලද අංක 2759 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X දරන,

ප්‍රමාණය පර්චස් විස්සයි දශම බිංදුවයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.05) හෙවත් (හෙක්ටයාර් 0.05071)

විශාල ඉඩම සහ ගොඩනැගිලි ගසකොළ සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

සින්නතම්බි සිවනන්දරාජා සහ සිවසුබ්‍රමනියම් නිත්‍යලක්ෂ්මි ණයකරුවන් ලෙස සහ සින්නතම්බි සිවනන්දරාජා උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2017ක් වූ මැයි මස 12 වැනි දින ප. ව. 12.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ ලක්බිම පත්‍රය ද, 2016.12.17 ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.04.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2017.04.11 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළවලට පිවිසීම. - ගාල්ලේ සිට කොළඹ පාර ඔස්සේ කොළඹ දෙසට මීටර් 430ක් පමණ ගමන් කළ විට අදළ දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 130,
මහා වීදිය, ගාල්ල.
දුරකථන අංක : 091-2234356/091-2242772
ෆැක්ස් අංකය : 091-2234356/091-2234467

04-157

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගාල්ල නගර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල කඩවත් සතරේ මහනගර සභා සීමාව තුළ ගාල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැලිපත හි පිහිටි ඕල්කොට් මාවතේ වරිපනම් අංක 57 දරන ලොට් 2 ඔරොප්පුවේ වලව්වේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ජේ. අරඹවෙල විසින් 1996 දෙසැම්බර් මස 19 වැනි දින මැන සාදන ලද අංක 1327 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X දරන

ප්‍රමාණය පර්චස් තුනක (අ. 0 රූ. 0 පර්. 3) විශාල ඉඩම සහ ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

සින්නතම්බි සිවනන්දරාජා සහ සිවනන්දරාජා සරතාතේවි ණයකරුවන් වශයෙන් සහ සිවනන්දරාජා සරතාතේවි උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2017ක් වූ මැයි මස 12 වැනි දින ප. ව. 12.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ ලක්බිම පත්‍රය ද, 2016.12.17 ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.04.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2017.04.11 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළවලට පිවිසීම. -
ගාල්ල කොමර්ෂල් බැංකුව ලඟින් වමට ඇති ඕල්කට් මාවතේ මීටර් 150ක් පමණ ගියවිට අදළ දේපළ වම්පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද VAT ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 130,
මහා වීදිය, ගාල්ල.
දුරකථන අංක : 091-2234356/091-2242772,
ෆැක්ස් අංකය : 091-2234356/091-2234467.

04-158

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගාල්ල නගර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

#### පළමුවන උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතරේ මහ නගර සභා සීමාව තුළ දංගෙදර හි පිහිටි ඕල්කොට් මාවතේ වරිපනම් අංක 49/9 ඒ දරන සහ ලොට් 9ඒ, 10ඒ, 11ඒ. 12ඒ, 13, 13ඒ, 14, 14ඒ සහ 15ඒ යාබදව සහ ඒකාබද්ධ කරන ලද ලොට් 02 සහ ඔරෝප්පුවේ වලව්වේ වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්. ලියනගේ විසින් 2006 මාර්තු 03 වැනි දින මැන සාදන ලද අංක 3712 ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් එක්ස් දරන ප්‍රමාණය පර්චස් නමයයි දශම හතයි දෙක (අ. 0 රූ. 0 පර්. 09.72) හෙවත් හෙක්ටයාර් 0.02459 විශාල ඉඩම සහ පස, ගසකොළ, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

#### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතරේ මහ නගර සභා සීමාව තුළ දංගෙදර හි පිහිටි ඕල්කොට් මාවතේ වරිපනම් අංක 55 දරන ඔරෝප්පුවේ වලව්වේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. වීසූරිය විසින් 2009 අප්‍රේල් මස 17 වැනි දින මැන සාදන ලද අංක 2368 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඊ දරන ප්‍රමාණය පර්චස් හතරයි දශම දෙකයි බිංදුව (අ. 0 රූ. 0 පර්. 4.20) විශාල ඉඩම සහ පස, ගසකොළ ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වේ.

#### තුන්වන උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ මහ නගර සභා සීමාව තුළ ගාල්ල කඩවත් සතරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨසයේ කළුවැල්ල 96සී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුඹල්වැල්ල ගමේ හි පිහිටි මහනගර සභා වරිපනම් අංක 75 දරන ලොට් බී ඔටියාපරංගිවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. වීරසූරිය විසින් 2011 නොවැම්බර් මස 03 වැනි දින සහ 2012 පෙබරවාරි මස 10 වැනි දින මැන සාදන ලද අංක 2759 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් එක්ස් දරන

ප්‍රමාණය පර්චස් විස්සයි දශම බිංදුවයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.05) හෙවත් (හෙක්ටයාර් 0.05071) විශාල ඉඩම සහ පස, ගසකොළ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

සින්නතම්බි සිවනන්දරාජා ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී හට ඉහත 1 වන, 2 වන සහ 3 වන උපලේඛනවල සඳහන් දේපළ උකස් කර ඇත.

1 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ. 0 රූ. 0 පර්. 09.72)
වර්ෂ 2017 ක් වූ මැයි මස 12 වැනි දින පෙ. ව. 11.00 ට ද

2 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ. 0 රූ. 0 පර්. 04.20)
වර්ෂ 2017ක් වූ මැයි මස 12 වැනි දින පෙ. ව. 11.30 ට ද,

3 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ. 0 රූ. 0 පර්. 20.05)
වර්ෂ 2017ක් වූ මැයි මස 12 වැනි දින ප. ව. 12.30 ට ද,

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම පත්‍රය ද, 2016.12.17 ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.04.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය 2017.04.11 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළවලට පිවිසීම. -

1 වන උපලේඛනය

ගාල්ල කොමර්ෂල් බැංකුව ලඟ සිට ඕල්කට් මාවත ඔස්සේ ගොස් දකුණට ඇති ඔරෝප්පුවත්ත පාරේ මීටර් 150ක් පමණ ගමන් කළ විට අදළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

2 වන උපලේඛනය

ගාල්ල කොමර්ෂල් බැංකුව ලඟින් වමට හැරුණු විට ඇති ඕල්කට් මාවතේ මීටර් 150ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

3 වන උපලේඛනය

ගාල්ලේ සිට කොළඹ පාර ඔස්සේ කොළඹ දෙසට මීටර් 430ක් පමණ ගමන් කළ විට අදළ දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අය බදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද VAT ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 130.
මහා වීදිය, ගාල්ල.
දුරකථන අංක : 091-2234356/091-2242772,
ෆැක්ස් අංකය : 091-2234356/091-2234467.

04-156

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : ඩීඑම්බී 144/13
ස්වභාවය:උකස්
වටිනාකම : රු. 1,545,000

එල්. බී. ෆිනෑන්ස් පීඑල්සී, අංක 275/75,
මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07.
........................පැමිණිලිකරු.

එදිරිව

ඉලන්දරිදේව මනෝජ් වික්‍රමසිරි,
මහාඒදණ්ඩ, කරන්දෙනිය,
............................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත්වී ඇති විකිණීමේ නියෝගය අනුව එකී නඩුවේ 2014 අප්‍රේල් මස 29 වැනි දින ඇතුළත්කර ඇති තීන්දු ප්‍රකාශය පරිදි රුපියල් පහළොස්ලක්ෂ හතලිස් හතරදස් දෙසීය පනස්හතරයි ශත පහළොවක මුදලක් (රු. 1,544,254.15) සහ 2013 අප්‍රේල් මස 09 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා මසකට 5% බැගින් ඒ මත පොළිය ද, ඉන්පසු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් තීන්දු ප්‍රකාශයේ මුළු මුදල මත පොළිය ද, විත්තිකරුගෙන් අයකර ගන්නා ලෙස පැමිණිලිකරුට නියම කර ඇත.

එසේ ගෙවීම පැහැර හැරියහොත් ඒ සඳහා බන්ධනය වී ඇති පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය අධිකරණය විසින් පත්කරන ද බලයලත් වෙන්දේසිකරුවෙකු ලවා අනුමත විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස ආඥා කොට තීන්දුකර ඇති හෙයින් පහත සඳහන් උපලේඛනයේ විස්තර කරනු ලබන එකී දේපළ වර්ෂ 2017ක් වූ මැයි මස 05 වැනි දින පෙ. ව. 11.30 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කරන්දෙණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කරන්දෙණිය මහගොඩ පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට ඒ. පී. එෆ් පෙරේරා නමැති බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 122 සහ 1972.12.11 සහ 22 දිනැති පිඹුරේ ප්‍රකාර කැබලි අංක ලොට් 7 දරන කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේ ලොට් 8 ද, නැගෙනහිරට : සහ දකුණට : අයි. ඩී. ගැල්ට්න්ට අයිති ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පර්චස් විසි හතරක් (අ. 0 රූ. 0 පර්. 24) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද සමග වේ. මෙම ඉඩම බලපිටියේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 10/90 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න,
බලයලත් වෙන්දේසිකරු/තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්.

අංක 220/5, දිමුතු මාවත, ගම්පහ පාර,
යක්කල.
දුරකථනය : 011- 2787314, 071-8208360, 033- 2222568

වැඩි විස්තර සඳහා .- එල්. බී. ෆිනෑන්ස් පීඑල්සී,
275/5, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07.
දුරකථනය : 011-4521000, 011-2155000.

04-36

### සෙලාන් බැංකුව පීඑල්සී - කළුතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මෙසස් සන්දීප බන්දුල ට්‍රාන්ස්පෝටර්ස් ඇන්ඩ් ඉන්ජිනියරිං ප්‍රයිවට් ලිමිටඩ් සහ දකුණු කළුතර පදිංචි මදුරගේ උපාලි දිසානායක, මදුරගේ දෙන් අනුර දිසානායක, මදුරගේ නිමල්චන්ද්‍රා දිසානායක සහ මදුරගේ මාලනී දිසානායක යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර බැද්ද, කළුතර තොටමුණ පලාතොට පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 2003 ජනවාරි මස 12 වැනි දිනැති අංක 2083/9000 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හිමිදිරියාවේකැලේ හෙවත් හේනෙවත්ත හෙවත් ෆීල්ඩ්විව් හෙවත් ලින්ටන් නමැති ඉඩමේ ලොට් අංක එක්ස් ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1984 දෙසැම්බර් මස 30 දිනැති අංක 1694 ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 11 ඒ, 12ඒ, සහ 13 ඒ ලෙස පෙන්නුම් කරනු ලබන ඉඩමේ එකතු කිරීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් දහඅටයි දශම දෙකක් (අ. 0 රූ. 1 පර්. 18.2) නොහොත් හෙක්ටයාර් 0.1471 ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 අප්‍රේල් මස 27 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- කළුතර ඔරලෝසු කණුව මංසන්ධියේ සිට පලාතොට පාරේ කි. මී. 1.5ක් පමණ ගිය විට දකුණුපසට ඇති පොලිස් පුහුණු කිරීමේ පාසලට යන මාර්ගයට හැරී තවත් මීටර් 200 ක පමණ දුරක් ගිය විට දකුණුපසට ඇති ප්‍රාදේශීය සභාවට අයත් පාරට හැරී මීටර් 30ක් පමණ ඉදිරියට ගොස් වම්පසට ඇති දේපළට පිවිසීම සඳහා ඇති පාරේ මීටර් 50ක් පමණ ගිය විට අදාළ දේපළ පාරේ දකුණුපසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2009.12.11 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.12.02 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.12.29 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456478, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ /අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011 - 2572940.

04-53

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කුරුඳුවත්ත ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ බත්තරමුල්ල ඒකකයේ, බත්තරමුල්ලේ, ජයන්තිපුර සෙන්ටර් පාරේ, පරගහකුරුඳුවත්ත හා අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග මහතා විසින් 2005 ජනවාරි මස 20 වැනි දින සාදන ලද අංක 4118 දරන පිඹුරේ දක්වා ඇති කැබලි අංක 3 දරන පර්චස් විසි අටයි දශම හයයි අට (අ. 0 රූ. 0 පර්. 28.68) ක් විශාල දේපළ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලුම දේ.

වර්ෂ 2017ක් වූ අප්‍රේල් මස 27 වැනි දින පෙරවරු 10.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - බොරැල්ල සිට රාජගිරිය හරහා බත්තරමුල්ල දෙසට ගමන් කරන විට හමුවන දකුණට වැටී ඇති පාර්ලිමේන්තු සංකීර්ණයට පිවිසෙන ශ්‍රී ජයවර්ධනපුර මාවතේ කිලෝ මීටර් 1ක් පමණ ගමන්කළ විට වම් පසට හමුවන ජයන්තිපුර බෝධිරාජ මාවතේ සෙන්ටර් පාරට මුහුණලා ඇති වරිපනම් අංක 20 දරන ස්ථානයේ මෙම අගනා දේපළ පිහිටා ඇත.

තව ද, මෙම දේපළ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් මිය විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙනුවෙන් ලියා සහතික කර ඇති 2012.01.17 දින දරන අංක 1468ත්, 2012.08.06 වැනි දින දරන අංක 1638ත්, 2013.03.28 වැනි දින දරන අංක 1830 සහ 2014.10.03 දින දරන අංක 2367 දරන උකස්කරයන් මත ''සිල්වර් ෂෝ හොලිඩේස් ප්‍රයිවට් ලිමිටඩ්'' ණයකරු වශයෙන් ගෙවීම් පැහැර හැර ඇත.

හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක යෝජනා සම්මුතිය සඳහාඃ

2016.11.04 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2016.11.09 වැනි දින ''ඩේලිමිරර්'' හා ''ලක්බිම'' සහ ''තිනකරන්'' පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය. -මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද, (2) පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු සියයට එකක (1%) විකුණුම් බදු ද, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකහමාරක් (2 1/2%)ක් ද, (4) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, (5) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 500ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000ක්ද වශයෙන් වූ මුලු මුදල එවේලේ ම මුදලින් ගෙවිය යුතු ය.

තව ද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%) වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරීන් විසින් හෝ පනවනු ලබන ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද සමග වෙන්දේසි දින සිට දින (30) තිහක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෙෂ්ඨ කළමනාකාර- වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා,
සාම විනිසුරු,
අධිකරණ හා වානිජ බැංකු පිළිගත් ජ්‍යෙෂ්ඨ
වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

ඉන්ටස්ටේට් ඔක්ෂන්ස්,
අංක 109/12ඒ, ගෝතමී පාර, බොරැල්ල,
කොළඹ 08.
දුරකථන අංක 011- 5367708, 077-1006829, 077-1316829, 072-226966
ඊමේල් : premalalnsilva@gmail.com

04-67

---

### මහජන බැංකුව - ආයතනික ශාඛාව

අංක 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන ඇ වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝරලායිපත්තු උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ වාකරෙයි කෝරළායි පත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 211සී පනිචන්කත්ති ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පනිච්චන්කත්ති ග්‍රාමයේ පනිච්චන්කත්තියෙහි පිහිටි බලයලත් මිනින්දෝරු කේ. කමලනාදන් මහතා විසින් සකස් කරන ලද 2016.06.10 දිනැති අංක කේකේ/බී/ටී/2010/0631 පිඹුරු අංක දරන පිඹුරේ නිරූපිත වලිමුනයි කොට්ඨාසයේ (ට්‍රැන්කුවලට් ස්ටේට් නමැති ඉඩමේ ලොට් 01 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම. ප්‍රමාණයෙන් අක්කර 10කින් (අ. 10, රූ. 0, ප. 0) එකී සම්පූර්ණ ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියලු දේ ද සමග වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2017 මැයි 06 වැනි දින පෙ. ව. 11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ ගැසට් පත්‍රයේ 2016.09.23 වැනි දින ද, 2016.04.30 දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල 2016.05.06 වැනි දින පළකර ඇත. වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- පාසිකුඩා සිට වාලච්චේනිය හරහා යනවිට වාකරෙයි හමුවේ. එතැන් සිට පානිච්චකුරා ගම දක්වා ගොස් දකුණට හැරී කි. මී. 4ක් පමණ යන විට, මුහුදු වෙරළ අයිනේ මෙම දේපළ හමුවේ.

ගෙවීමේ ක්‍රමය. -

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 1 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කළමනාකරු, මහජන බැංකුව, බලපිටිය ශාඛාව, (154) යන ලිපිනයට ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ඇතුළත නොගෙවුහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිනීමට බැංකුවට අයිතියක් ඇත. අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමානාකාර මහතා, මහජන බැංකුව, ආයතනික ශාඛාව, ලේක්හවුස් ගොඩනැගිල්ල, 35, 1 වැනි මහල, දොස්තර විජේවර්ධන මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011- 2437239/41 ෆැක්ස් අංකය : 011- 2448067.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු/සාමවිනිසුරු,
(මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක 011- 2053826, 011- 5756356
072-3836742, 072-3207533.

04-168

---

### මහජන බැංකුව - ආයතනික ශාඛාව

අංක 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන ඇ වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලෙපත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවේ, නුගේගොඩ, ග්‍රාමසේවක නිලධාරි කොට්ඨාසයේ අංක 519, මහලේකම් කොට්ඨාසයට අයිති කොට්ටන්ළුවෙකුඹුර කැබලි අංක 01 දරන කොටස පිඹුරු අංක 3361 2006.01.02 වැනි දින බලයලත් මිනින්දෝරු එල්. එම්. එන්. පෙරේරා විසින් සාදන ලද පිඹුරට අයත් ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 31.40 ක් සහ ඊට අයත් සියලුම දේ ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2017 මැයි 14 වැනි දින පෙ. ව. 11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ ගැසට් පත්‍රයේ 2016.03.16 වැනි දින ද, පුවත්පත්වල 2016.02.29 වැනි දින පළකර ඇත. වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- නුගේගොඩ පාරේ ජුබිලි කණුව අසලට ගොස් ස්ටැන්ලි තිලකරත්න මාවතේ මීටර් 600ක් පමණ වන විට වම් අත පැත්තේ පාරට මුහුණලා පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය -

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 1 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමනාකරු (අයකිරීම්), මහජන බැංකුව, ආයතනික ශාඛාව, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයට ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011- 2437239-41 ෆැක්ස් අංකය : 011- 2448067.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු,
(මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක : 0112- 419126, 011- 4280136
0723-3836742, 072-3207533.

04-169

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - නගර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා කොට්ඨාසයේ බත්තරමුල්ල උප කාර්යාල සීමාවේ දකුණු තලංගම මහකුරුඳුවත්ත පාරේ වරිපනම් අංක 65/21 දරන සාන්ත තෝමස් වත්ත (කොටසක්) වශයෙන් දැක්වෙන දෙල්ගහවත්ත අලුබෝගහලන්ද බතලදෙණියකැළේ, බතලවත්තදෙණිය බුන්වැල්ලගොඩැල්ලකැලේ හොරගහමණ්ඩිය කැලේ බටදෙණියකැලේ ගොරකගහවත්ත ඇතුන්කෑදෙණිය හොරගහවත්ත නුගගහවත්ත අලුබෝගහදෙණිය සහ අලුබෝගහදෙණියඕවිට නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ හා අනෙකුත් සියලු දේ සමග වන බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු හා බිම් සැකසුම්කරු එස්. වික්‍රමසිංහ විසින් 1993 නොවැම්බර් මස 25 වැනි දින සාදන ලද පිඹුරු අංක 6322 දරන පිඹුරේ ලොට් 1සී1 දරන කැබැල්ලට (නැවත මැන බෙදාවෙන්කොට 2005 අගෝස්තු මස 11 වැනි දින සාදන ලද බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් විසින් සහතික කරන ලද පිඹුරු අංක 1462 හි ලොට් 9 දරන පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාලත්වයෙන් යුත් ඉඩම ගොඩනැගිලි සහ ගහකොළ වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමඟ වේ.

ඉහත සඳහන් සාන්ත තෝමස් වත්තේ කොටස් වන -
ලොට් 14 (අ. 0 රූ. 0 පර්. 23.76)
ලොට් 1 සී 3 (අ. 0 රූ, 0 පර්. 1.5)
ලොට් 1 බී (අ. 0 රූ. 0 පර්. 1.5)
ලොට් ඒ 9 (අ. 0 රූ. 1 පර්. 6)
ලොට් ඒ 5 බී (අ. 0 රූ. 0 පර්. 21.6)

ඉහත සඳහන් ඉඩම්වලින් ඇති ප්‍රවේශ අයිතිය සමග වේ.

ගිනිගේ නලින් රවින්ද්‍ර ප්‍රනාන්දු ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2017ක් වූ මැයි මස 05 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.29 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.04.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2017.04.07 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. - බත්තරමුල්ල නගර මධ්‍යයේ සිට තලවතුගොඩ පාරේ ගියවිට කුමාරගේ වත්ත හංදිය හමුවේ. එතැනින් කුමාරගේවත්ත පාරේ මීටර් 300ක් පමණ දුර ප්‍රමාණයක් ගිය විට මහකුරුඳුවත්ත පාර හමුවේ. එම පාරේ වරිපනම් අංක 65/21කේ මහකුරුඳුවත්ත දරන අදාළ දේපළ පිහිටා ඇත. (සෙලින්කෝ නිවාස සංකීර්ණය) තලවතුගොඩ දකුණ

ගෙවීමේ ක්‍රමය. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) අකාලික වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (09) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමණාකරු (ණය අයකර ගැනීම්),
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
අංක 21,
ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01
දුරකථන අංක 011- 2486770
ෆැක්ස් අංකය : 011- 2347717.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

04-159

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුවෙහි සිය ලියාපදිංචි අංක පීවී 9624 හි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන විහිකල්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සහ මීගමුව හි පදිංචි හන්දුන් හර්ෂ ප්‍රභාත් ද සිල්වා යන අය බන්ධනදායී වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් දෙක ම සහතික කරන ලද දෙකම 2012 නොවැම්බර් මස 19 දිනැති අංක 2740 සහ 2741 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති දේපළ, වර්ෂ 2017ක් වූ අප්‍රේල් මස 24 වැනි දින පිළිවෙළින් පෙ. ව. 9.00 ට සහ 9.15 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ දූනුගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඔස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2009.09.14 දිනැති අංක 6392 සැලැස්මේ නිරූපණය වන ගිරිඋල්ල පාර, වරිපනම් අංක 363 සහ 367/1 දරන දවටගහවත්ත සහ මාවතගහවත්ත හෙවත් දවටගහවත්ත නමැති බෙදුවෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම එකයි පහක් (අ. 0 රූ. 1 පර්. 38.15) විශාල ගොඩනැගිලි ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ දූනුගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2011.12.27 දිනැති අංක 6962/1 සැලැස්මේ නිරූපණය වන ගිරිඋල්ල පාර, වරිපනම් අංක 365 දරන දවටගහවත්ත නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.65) විශාල ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

දේපළට පිවිසීම. - මීගමුව නගරයේ ප්‍රධාන වීදිය ඔස්සේ කොප්පරා හන්දිය හමුවේ. එහි සිට මිරිගහ පාරෙන් "Y" හන්දියෙන් ගිරිඋල්ල පාරේ සිට කිලෝ මීටර 1ක් යන විට වම් පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- 2015.07.03 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, 2015.06.22 දිනැති ඩේලිමිරර් ලංකාදීප සහ 2015.07.06 දිනැති තිනකුරල් පුවත්පත් හි පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 500,
6. සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,
7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා අණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙ වුවහොත් දැනටමත් ගෙවාඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සමාන්‍යාධිකාරී-නීති සෙලාන් බැංකුව පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011- 2456485, 011- 2456479.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි- හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071-4318252 - 011 - 2173282.

04-166

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම.

ණය පහසුකම් යොමු අංක - 72520869 සහ 73885208
නොච්චියාගම, මුදිතාගම, අංක 208 හි පදිංචි
1. දිල්ෂාන් චතුරංග සමරසිංහ මයා
2. මාලනී ගජසිංහ ගමගේ හෙවත් මාලනී ගජසිංහ හෙවත් ගජසිංහ ගමගේ මාලනී මිය යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.08.19 දිනැති අංක 1981 දරන ගැසට් පත්‍රයේ හා 2016 අගෝස්තු මස 10 වැනි සිකුරාද දින ''දිනමිණ'' ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද නිවේදන වලට අනුකූලව මුල් ණය මුදල් වල ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2017.05.04 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### ඉහත සඳහන් උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විලච්චිය කෝරළේ අංක 337 දරන මුදිතාගම ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ හිරියාලේගම ග්‍රාමයේ පිහිටි ''ස්ටේට් ලෑන්ඩ්'' නමැති ඉඩම කැබැල්ල උතුරට : ගම්සභා පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : ලොට් අංක 19 ද, දකුණට : පුත්තලම පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරට : ජී. වී. පිනාට අයත් ඉඩම ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් දහසයක (අ. 0 රූ. 2 පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත් වේ. මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 212/30 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ඩබ්. රත්නසිරි විසින් මැතක දී කරන ලද මැනීමකට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී හිරියාලේගම පිහිටියාවූ බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2012.09.04 දිනැති අංක 5578 දරන පිඹුරෙහි ලොට් අංක 1 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : මෙම පිඹුරෙහි ලොට් 2 (අතිරික්ත වගාව) ද නැගෙනහිරට : ලොට් අංක 19 (එස්. කුමාරසිංහට අයත් ඉඩම ) ද, දකුණට : පාර (RDA) දිගට ඇති පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරට : ජී. වී. පිනාට අයිති ඉඩම ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් දහසයක් (අ. 0 රූ. 0 පර්. 16) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි හතරයි දෙකයි අටක (හෙක්ටයාර 0.2428) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. බී. ඩබ්. ඩී. කේ. රලපනාව,
කළමනාකරු.

ලංකා බැංකුව,
නොච්චියාගම.

04-215

---

**I කොටස : I ඡෙදය යටතේ පළවන දැන්වීම් 2017.04.07 වැනි දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk